සහතික පිටපත

නඩු අංකය : බී.ආර්.6314/23

Adheesha Ariyathilaka

03 MAR 2025
මාතර

මාතර මහේස්ත්‍රාත් අධිකරණයේදීය.

මහේස්ත්‍රාත් බී.ඒ.අරුණ ඉන්ද්‍රජිත් බුද්ධදාස මැතිතුමා ඉදිරිපිටදීය.

සටහන : ල.ලේ. සංජීව.

නඩු අංකය:BR/6314/2023 දිනය: 2025.02.27

## නි යෝ ග ය

වැලිගම පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා විසින් 2023.12.31 දිනැති තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කර මාතර මහේස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශය තුල පිහිටි වැලිගම පොලිස් වසමේ පැලැන වටරවුම අසල "W15" නැමති හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධියක් සිදුව ඇති බවත් එහි ප්‍රතිඵලයක් හේතුවෙන් පොලිස් නිලධාරියෙකු මියගොස් තවත් පොලිස් නිලධාරියෙකුට තුවාල සිදුව ඇති බවටත් කරුණු වාර්තා කරමින් අපරාධ ස්ථානය පරීක්ෂා කර මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. එම ඉල්ලීම ප්‍රකාරව සිදුවීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත ප්‍රකාරව මහේස්ත්‍රාත් පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. යම් පුද්ගලයෙකුගේ මරණයක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරියෙකු මගින් හෝ අන්කිසි ආකාරයකින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් වූ විට මහේස්ත්‍රාත්වරයා විසින් කටයුතු කලයුතු නිශ්චිත ආකාරය සම්බන්ධයෙන් සහ මහෙස්ත්‍රාත්වරයාගේ නීතිමය වගකීම සම්බන්ධයෙන් පවතින නෛතික විධිවිධාන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත මගින් පනවා නියම කර ඇත. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ (II)



Adheesha Ariyathilaka

වන පරිච්ඡේදයේ 09 වන වගන්තියේ (ආ) (1) සහ (2) වගන්තිද, (XIV) පරිච්ඡේදයේ 136, 138, 189, 143 යන වගන්තිද (XXX) වන පරිච්ඡේදයේ 369, 370, 371, 373 වගන්තිද එක්ව සහ සමගාමීව සලකා බැලීමෙන් අනතුරුව එකී ලිඛිත වාර්තාව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136(1)(ආ) වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පැවරීමක් ( Institution of proceedings in a Magistrate s court ) ලෙස නිගමනය කරමින් මෙම නියෝගය ප්‍රකාශයට පත් කරමි.

ඒ අනුව 136(1)(ආ) වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පරීක්ෂණයක් පැවැත්වීමට බලය ඇති වරදක් කර ඇති බවට වැලිගම පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත වාර්තාව මගින් වෙඩි තැබීමක් හේතුවෙන් පොලිස් නිලධාරියෙකු වන පොලිස් සැරයන් 57241 උපුල් නිලධාරියා මියගොස් ඇති බව වාර්තා කර ඇත. ඒ අනුව එවැනි කරුණක් සම්බන්ධයෙන් තොරතුරු අධිකරණයට වාර්තා වූ වහාම අධිකරණය විසින් කටයුතු කලයුතු ආකාරය සම්බන්ධයෙන් වන නෛතික වගකීම ප්‍රධාන පියවර දෙකකින් යුක්ත බව නෛතික ප්‍රතිපාදන අනුව අධිකරණය එළඹෙන නිගමනය වේ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ (III) පරිච්ඡේදයේ 9 (ආ) (III) වගන්තිය මගින් ප්‍රචණ්ඩ ක්‍රියාවකින් හෝ හදිසි අනතුරකින් සිදුවූ හෝ මරණ පිලිබඳව පරීක්ෂණයක් කිරීම සඳහා වන අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයට පවරා හිමිකර දී ඇත. එලෙස පවත් වනු ලබන පරීක්ෂණයක ( Inquire ) මත ආකාර දෙකක නෛතික ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් අධිකරණය විසින් සිය නිගමනයන් නඩු

කටයුත්තේදී ඉදිරිපත් කල යුතු බව නීතිමය කරුණු මත අධිකරණයේ පිළිගත නිගමනය වේ. ඉන් පළමු මහේස්ත්‍රාත් අධිකරණය සතු නෛතික වගකීම යනුයේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ (VIII) වන කොටසේ විශේෂ පරීක්ෂණ කටයුතු පිලිබඳ ශීර්ෂය යටතට ඇතුළත් (XXX) වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ මරණ පරීක්ෂණයක් (Inquests of Death ) පවත්වා මරණකරුගේ මරණයට අදාලව වන දෘෂ්‍යමාන හේතුව ( Appearent cause of deth) ප්‍රකාශයට පත් කිරීමයි. මහේස්ත්‍රාත් අධිකරණය සතු දෙවන වගකීම වන්නේ පවත්වන ලද පරීක්ෂණය පාදක කර ගෙන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 138 වගන්තිය අනුව යම් තැනැත්තෙකුට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන විට 139 වගන්තිය අනුව අධිකරණ නියෝගයක් නිකුත් කිරීමයි. ඒ අනුව වර්ෂ 2025 ක් වූ පෙබරවාරි මස 06 දින පවත්වන ලද මෙම නඩුවට අදාල මූලික විමර්ශන කටයුතු අවසානයේ වාර්තා ගොනු කර ඇති බැවින්ද, පැමිණිල්ල මෙහෙයවන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාචිකව අධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණුද සලකා බලා එම ඉහත සඳහන් කරන ලද නෛතික වගකීම් දෙක සබැඳිව වන, පරීක්ෂණයට අදාල අධිකරණ නියෝග මෙයින් පහත ආකාරයට ප්‍රකාශයට පත් කරමි.

ස්ථානාධිපතිවරයා විසින් තොරතුරු වාර්තාව ඉදිරිපත් කල පසුව පනතේ 143 වගන්තිය ප්‍රකාරව ස්ථානීය මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදු කර ඇති අතර එහි නිරීක්ෂණ ඇතුලත් ලිඛිත වාර්තාවක් නඩු ගොනුවට ඇතුලත් කර ඇත. එහි වැඩිදුර පරීක්ෂණයට අදාලව විමසීමක් පවත්වා ඇති අතර සාක්ෂිකරුවන්ගේ

සාක්ෂි වාර්තාගතව නඩු ගොනුවට ගොනු වී ඇත. මරණකරුගේ භෞතික මෘත ශරීරය නිරීක්ෂණය පිළිබඳ අවස්ථාව වන විට ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශයට ඇතුළත් කරාපිටිය ශික්ෂණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර තිබියදී මාතර මහේස්ත්‍රාත්වරයාගේ ඉල්ලීම ප්‍රකාරව ගාල්ල ගරු අතිරේක මහේස්ත්‍රාත්තුමිය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 370 වගන්තියේ ප්‍රතිපාදන අනුව භෞතික මෘත ශරීරය පරීක්ෂා කර නිරීක්ෂණයන් සටහන් කරමින් සහ පශ්චාත් මරණ පරීක්ෂණයට අදාලව නීතිමය නියෝග නිකුත් කර ඇත. එකී මහේස්ත්‍රාත් පරීක්ෂණයට අදාල මහෙස්ත්‍රාත්තුමියගේ වාර්තාවද නඩු ගොනුවට ඇතුලත්ව ඇත. එම නියෝග ප්‍රකාරව මියගිය තැනැත්තා වන පො.සැ.57241 උපුල් නැමැත්තාගේ මෘත ශරීරයට අදාලව පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී එච්.ඒ.විෂාකා පෙරේරා යන අය විසින් නිකුත් කරන ලද මරණ පරීක්ෂණ අංක AR/3170/23 නඩු අංකයට BR/6314/23 සහ 2024.10.03 දාතම සහිත පිටු 08 කින් සමන්විත වෛද්‍ය වාර්තාවද නඩු වාර්තාවට ගොනුවී ඇත. විමර්ශනයන්ට අදාලව අධිකරණ නියෝග මත කරන ලද විමර්ශන ප්‍රගතිය පිළිබඳ වාර්තාද රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාද අධිකරණයට ගොනුවී ඇත. ඒ අනුව අධිකරණය සතු මූලික නෛතික වගකීම මෙම නඩුවේදී පරීක්ෂණයන්ට භාජනය වී ඇති සිදුවීමේදී මරණයට පත්වූ තොරතුරු වාර්තාවේ පො.සැ.57241 උපුල් ලෙස සඳහන් මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර යන තැනැත්තාගේ මරණයට අදාලව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 370

වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව මරණය පිලිබඳ දෘශ්‍යමාන හේතුව නිගමනය කර ප්‍රකාශයට පත් කිරීමයි.

03 MAR 2025

එකී මරණයට හේතු පාදක වූ සිදුවීම සම්බන්ධයෙන් සිය ලිඛිත වාර්තාව මගින් වැලිගම පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා අධිකරණයට වාර්තා කර ඇත්තේ 2023.12.31 වන දින වැලිගම පොලිස් ස්ථානයේ පොලිස් සැරයන් 16089 සිසිර නිලධාරියා, පොලිස් කොස්තාපල් 38762 ඉන්ද්‍රතිලක, යුධ හමුදා සැරයන් 02725 G.C.T. රුවිරංග, යුධ හමුදා සාමාන්‍ය සෙබල 102416 ප්‍රභාත් ඇතුළු පරිසක් පොලිස් සැරයන් රියදුරු 7809 විතාන නිලධාරියා විසින් පදවන ලද අංක WPGC – 0320 දරන ජීප් රථයෙන් රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටියදී අළුයම පැය 0230 ට පමණ ගාල්ල-මාතර ප්‍රධාන මාර්ගයේ මාතර සිට ගාල්ල දෙසට ගමන් කරමින් සිටියදී පැලෑන වටරවුම අසල පිහිටි "W15" හෝටලය ඉදිරිපිට නවතා තිබූ සුදු පැහැති KDH වර්ගයේ වෑන් රථයකින් පැමිණි පිරිසක් විසින් වෙරළ දෙසට වෙඩි තැබීමක් සිදු කරනු දැක ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී පොලිස් සැරයන් 16089 සිසිර නිලධාරියාගේ නියෝග මත යුධ හමුදා සැරයන් 02725 සී.ටී.සී.රුවිරංග නිලධාරියා විසින් එම වෑන් රථය දෙසට වෙඩි තැබීමක් සිදු කර ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙසට වෑන් රථයේ ගමන් කල කොළඹ අපරාධ කොට්ඨාශයට අනුයුක්ත නිලධාරීන් බවට පසුව හඳුනාගනු ලැබූ පො.සැ.57241 උපුල් නිලධාරියා මියගොස් ඇති බවත් උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා තුවාල ලබා ඇති බවත්, එහිදී ස්ථානාධිපතිවරයා විසින් තොරතුරු වාර්තාවේ සඳහන් කර ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලන්ද සිල්වා, පොලිස්

පරීක්ෂක ජගත් නිශාන්ත, පොලිස් පරීක්ෂක එම්.ආර්. යුදුසිංහ, උප පොලිස් පරීක්ෂක මධුරංග, පොලිස් සැරයන් 57241 උපුල්, පොලිස් සැරයන් 69480 කුමාර, පොලිස් කොස්තාපල් 2204 ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් නිලධාරී විසින් පදවන ලද රථයකින් අපරාධකරුවකු අත්අඩංගුවට ගැනීමට පැමිණ එම අය අත්අඩංගුවට ගැනීමට කටයුතු සිදු කිරීමේදී මෙම නඩුවේ මරණයට අදාල සිදුවීම සිදුව ඇති බවයි.

අදාල මරණකරුගේ මරණය සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණයට අදාලව සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු සාක්ෂි ලබා දී ඇත. එකී සාක්ෂි දී ඇති සාක්ෂිකරුවන් පහත පරිදිය.

1. සාක්ෂි අංක 01- ඉමදුව විතානගේ අජිත් සිසිර කුමාර, පොලිස් සැරයන් 16089- වැලිගම පොලිස් ස්ථානය. ( දෙවන වෙඩි තැබීමට නියෝගය දුන් පොලිස් නිලධාරී )
2. සාක්ෂි අංක 02 - ගම්මැද්ද වන්සක්කාරලාගේ චන්දිමාල් රුචිරංග, - 02725 යුධ හමුදා සැරයන්.( දෙවන වෙඩි තැබීම සිදු කල යුධහමුදා නිලධාරියා )
3. සාක්ෂි අංක 03 - උදේශ දිල්ෂාන් ජයසිංහ, පොලිස් කොස්තාපල් 40494 - ඉමදුව අධිවේගී අන්තර් හුවමාරු ඒකකය.
4. සාක්ෂි අංක 04 - සමරකෝන් විජේවික්‍රම විදාන මුහන්දිරම්ගේ උපුල් වසන්ත ඇල්වින් විජේවික්‍රම, පොලිස් සැරයන් 1822 - ඉමදුව අධිවේගී අන්තර් හුවමාරු ඒකකය.

03 MAR 2025

5. සාක්ෂි අංක 05 – වික්‍රමසූරිය විනෝද්, ආරක්ෂක නිලධාරි W15 හෝටලය.

6. සාක්ෂි අංක 06 - සරුන්නාලි පටබැඳිගේ ධර්මප්‍රිය ජගත් නිශාන්ත, පොලිස් පරීක්ෂක, කොළඹ අපරාධ කොට්ඨාශය.

7. සාක්ෂි අංක 07 - අමරසිංහ කුමාආරච්චිගේ දුලිප් ගිහාන් පියතිස්ස, පොලිස් කොස්තාපල් රියදුරු 89728, කොළඹ අපරාධ කොට්ඨශය.

8. සාක්ෂි අංක 08 - රිකිල්ලපාන ලියනගේ රොෂාන් මධුරංග, උප පොලිස් පරීක්ෂක, කොළඹ අපරාධ කොට්ඨාශය.( පළමු වෙඩිතැබීම සිදු කල පොලිස් නිලධාරියා )

9. සාක්ෂි අංක 09 -රත්දුනි යුමෙන් ඇනස්ලච්ද සිල්වා, ප්‍රධාන පොලිස් පරීක්ෂක- කොළඹ අපරාධ කොට්ඨාශය.

10. 10 වන සාක්ෂිකරු - හීනංගල වීබද්දගේ නෙස්මිල උපුල් කුමාර, ප්‍රධාන පොලිස් පරීක්ෂක, මූලස්ථාන පොලිසිය, වැලිගම.


11. 11 වන සාක්ෂිකරු - සුබසිංහගේ ආරියවංශ සුබසිංහ, උප පොලිස් පරීක්ෂක, අපරධ ස්ථාන පරීක්ෂණනාගාරය, පොලිස් අධිකාරී කාර්යාලය, මාතර.

එම සාක්ෂිකරුවන්ට අමතරව මියගිය තැනැත්තාගේ භෞතික මෘත ශරීරය සම්බන්ධයෙන් අධිකරණ නියෝග මත පවත්වන ලද පශ්චාත් මරණ පරීක්ෂණයට අදාල පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ( post-Mortem report ) AR/3170/23 අංකය සහ BR/6314/23 දරණ නඩු අංකයද යටතේ 2024.10.03 දාතම සහිතව කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය

නිලධාරී එච්.ඒ.විශාඛා පෙරේරා විසින් 2023.02.31 දිනැතිව සිදුකල මරණ පරීක්ෂණයට අදාලව අධිකරණයට ඉදිරිපත් කර නඩු වාර්තාවට ගොනුවී ඇත. ආණ්ඩුවේ ජොෂ්ඨ සහකාර රස පරීක්ෂක සහ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක අත්සන දරන රස පරීක්ෂක වාර්තාද නඩු වාර්තාවට ගොනු වී ඇත. අධිකරණ නියෝග ප්‍රකාරව සහ පවත්වන ලද වැඩිදුර විමර්ශන මත පදනම්ව මුල් අවස්ථාවේදී වැලිගම පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා විසින්ද, පසුව විමර්ශන 2024.10.22 දින පටන් භාරගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගොනු කරන ලද වැඩිදුර විමර්ශන ප්‍රගතිය ඇතුලත් වාර්ථාද, එම විමර්ශන වලට සම්බන්ධිත විවිධ ලේඛන සහ සෙසු සාක්ෂිද නඩු වාර්ථාවට ගොනුකර ඇත. එම සියළුම සාක්ෂි, නඩු භාණ්ඩ, වාර්තා, ලේඛන සහ සාක්ෂි සම්පිණ්ඩන ඇතුලත් තොරතුරු වාර්තා යනාදී සියල්ල සලකා බැලීමෙන් සහ නීතියේ පදනම මත පිහිටා අගය කරමින් පහත නිගමනයන්ට එළඹෙමි.

මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර යන මරණකරු කොළඹ අපරාධ කොට්ඨාශයට අනුයුක්ත සෙසු නිලධාරීන් 07 දෙනෙකුද සමග සුදු පැහැති ටොයෝටා KDH වර්ගයේ ලියා පදිංචි අංකය ලෙසට අංක WPPK - 7225 ලෙස සටහන්ව ඇති වෑන් රථයෙන් ගමන් කරමින් සිට ඇති බවත්, මාතර අධිකරණ බල ප්‍රදේශයේ පැලෑන වටරවුම අසල පිහිටා ඇති “W15” හෝටලය ඉදිරිපිටදී වෙඩිතැබීමක් මගින් ශරීරයට වැදුනු වෙඩි පහර හේතුවෙන් මරණයට පත්ව ඇති බවයි. එකී වෙඩි වැදීම දුවූ ස්ථානයේ සිට තුවාලකරුද රැගෙන පොලිස් අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් පිරිස අධිවේගී මාර්ගයට ඉමදුව

අධිවේගී පිවිසුම හරහා ඇතුලත්ව කොළඹ දෙසට ගමන් කිරීමට උත්සාහ කර ඇති බවත්, වැලිගම පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින් සිදු කරන ලද විමර්ශනයට අදාලව ඉමදූව අධිවේගී පිවිසුමේදී පොලිස් භාරයට ගෙන ගාල්ල කරාපිටිය රෝහලට 1990 සුවසැරිය ගිලන්රථයක් මගින් ඇතුලත් කිරීමක් සිදුකර ඇති බවත්, එලෙස රෝහලට ඇතුලත් කරන විටත් වෙඩි වැදීමෙන් තුවාල ලබා සිටි තැනැත්තා මියගොස් සිටි බව වෛද්‍යවරුන්ගේ නිගමනය වී තිබූ බවටත් සාක්ෂිමය වශයෙන් කරුණු අනාවරණය කර ඇත. සාක්ෂි අංක 06 ලෙස සාක්ෂි දී ඇති පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත යන අය සිය සාක්ෂියේදී ඔවුන් ගමන් කල වෑන් රථයේ අසුන් සැලැස්ම සහ ගමන්කල නිලධාරීන් අසුන්ගෙන සිටි පිලිවෙල පිලිබඳව සාක්ෂි ලබා දී ඇත. එම සාකෂිය අනුව එම සුදු පැහැති ටොයෝටා KDH රථයේ ලියාපදිංචි අංකය WPPK-7225 දරන රථයේ ඉදිරිපස රියදුරු අසුන සහ සෙසු ඉදිරි අසුන හැරුණු විට පිටුපස කොටසේ එකක තිදෙනෙකු බැගින් වාඩිවී ගමන් කල බවත්, ඉදිරියෙන් සහ පිටුපස දොර අසල අසුන් 02 ක් පමණක් සවිකර තිබී ඇති අතර එම අසුන් දෙක මැද පිහිටි අසුන ඉවත් කර තරමක් ඉඩකඩ සහිත විවෘත ස්ථානයක් ලෙසට සකස් කර තිබී ඇත. එකී අසුන් අතරින් පිටුපස අසුනේ වම් කෙලවර අසුනේ මරණකරු අසුන් ගෙන සිටි බවට සාක්ෂි මගින් කරුණු දක්වා ඇත. රථය මහේස්ත්‍රාත් පරීක්ෂණයට අදාලව පරීක්ෂාවට ලක් කර ඇති අතර, රස පරීක්ෂකවරයා විසින්ද පරීක්ෂාවට ලක්කර ඇත. එකී පරීක්ෂාවන්ට අදාලව ඉදරිපත්වූ කරුණු අනුව වෑන් රථයේ ගමන්ගත් තැනැත්තන් පිලිබඳ ආසන ස්ථාන පහත පරිදි දල සැලැස්මකට ඇතුලත් කිරීම මගින් හඳුනා ගනිමි.





දල සැලැස්ම අංක 01.

( වෙඩි තැබීම සිදුවු "W15" හෝටලය අසලදී මරණකරු ගමන්කල රථයේ පිරිස අසුන් ගෙන සිටි පිළිවෙල )

එම සාක්ෂිකරු සාක්ෂි දෙමින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ වෙඩි හඬක් ඇසීමෙන් අනතුරුව පිටුපස අසුනේ සිටි තිදෙනාම ඉදිරියේ විවෘත කලාපයට බිම පතිත වී සිටි බවත් ඇනස්ලම් නිලධාරියා උපුල්ට වෙඩි වැදුණු බව ප්‍රකාශ කල බවත්ය. තුවාලකරු ගුගල් සිතියම ආධාරයෙන් කරාපිටිය රෝහලට රැගෙන යාමට උත්සාහ කලද ඉමදූව හුවමාරුවේ නිලධාරීන් එය වලක්වන ලද බැවින් තුවාලකරු රැගන යාමට නොහැකි වුණු බවටත් සාක්ෂි ලබාදී ඇත. මරණ පරීක්ෂණයේදී සාක්ෂි දී ඇති අංක 2 සාක්ෂිකරු වන රුවිරංග නැමති යුධ හමුදා සැරයන්වරයා සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ ඉහල නිලධාරීන්ගේ නියෝග මත විශේෂ රාජකාරි පදනම යටතේ වැලිගම පොලිසියේ ජංගම රාජකාරියේ නියුක්ත රථයේ පො.ප.සිසිර නිලධාරියා යටතේ රාජකාරි කරමින් සිටි අවස්ථාවේදී වැලිගම පැලෑන ප්‍රදේශයේදී මෙම විෂයගත වෙඩි තැබීම තමන් විසින් සිදුකල බවයි. එම සාක්ෂි අනුව එම ජංගම මුර සංචාර රථය මිරිස්ස මුරපොලෙහි සිට ගාල්ල දෙසට මාතර ගාල්ල ප්‍රධාන මාර්ගය ඔස්සේ ගමන් කරමින් සිට ඇති බවත්, ජංගම මුර සංචාරයේ නියුතු රථයේ ඉදිරිපස රියදුරු අසුන සහ වම් පස අසුනට පිටුපසින් ඉදිරියේ සිට පසුපසට පිහිටා ඇති පැති බිත්ති දෙසට වන අසුන් පිහිටුවීමක් එම රථයේ තිබී ඇති බවත්, රියදුරු අසුනට පිටුපසින් පිහිටි අසුනේ 2 වන සාක්ෂිකරු වන ගිණිඅවිය ක්‍රියාත්මක කල යුධ හමුදා සෙබල රුවිරංග සහ යුධහමුදා සෙබල ප්‍රභාත් යන අය අසුන්ගෙන සිට ඇති බවත් සාක්ෂි අනුව නිගමනය කරමි. එයට මුහුණලා පිහිටි අසුනේ පොලිස් නිලධාරී ඉන්ද්‍රතිලක යන නිලධාරියා අසුන්ගෙන සිට ඇත.

ආසන පිහිටීම සහ නිලධාරීන් අසුන්ගෙන සිටි පිලිවෙල පහත පරිදි දල සැලැස්මකට ඇතුලත් කර හඳුනා ගනිමි.

(WPGC-0320 රථය )




දල සැලැස්ම අංක 02.

("W15" හෝටලය ඉදිරිපිටදී වෙඩිතැබීම සිදුකල අවස්ථාවේදී නිලධාරීන් අසුන්ගෙන සිටි පිළිවෙල පිළිබඳ සාක්ෂි මත සලකුණු ලබන දල සටහන )

වෙඩි තැබීම සිදුකල නිලධාරියා වන අංක 2 සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ KDH වර්ගයේ වෑන් රථයේ තමන් ගමන්කරමින් සිටි මාර්ගයේ වම්පස අයිනේ පිහිටි "W15" හෝටලය අසල ගේට්ටුව ලඟ නවත්වා එහි සිටි පිරිස හෝටලයට වෙඩි තබමින් සිටි බවත් තමන් ගමන්කල ජීප් රථය.



Adheesha Ariyathilaka

එම වෑන් රථය පසුකර ඉදිරියට ගොස් මාර්ගය අයිනේ නතර කර සිසිර මහතා ජීප් රථයෙන් බැස්ස බවත් එහිදී වෑන් රථයේ පිරිස කලබලවී පලායාමට උත්සාහ කල බවත්ය. එම අවස්ථාවේදී වාහනය නැවැත්වීම සඳහා වෑන් රථයේ රෝද වලට වෙඩි තැබීමට කණ්ඩායම් භාර නිලධාරී සිසිර මහතා තමාට නියෝග ලබාදුන් බවත්, ක්ෂනිකව ක්‍රියාත්මක වී තමාට යාබදව වාඩිවී සිටි සිය සහායක නිලධාරී යුධ හමුදා සෙබල ප්‍රභාත් යන අය අත තිබූ T-56 මාර්ක් 02 වර්ගයට අයත් 5380171 දරන ගිණි අවියෙන් තමා වාඩිවී සිටි ජීප් රථයේ දකුණු පස පිහිටි පළල අඩි 1 ½ ක් සහ උස අඩි 1 ½ ක් පමණ වන විවෘත කවුළුවෙන් තුවක්කුව පමණක් එළියට දමා ජීප් රථයේ දකුණු පැත්තෙන් එයට ඉස්සර කර ගමන් කරමින් සිටි වෑන් රථයට ටයර් ප්‍රදේශයට කුරුමානම ගෙන වන් බයි වන් ක්‍රම වේදය අනුව උණ්ඩ 07 ක් වෙඩි තැබූ බවයි. තමා තබන ලද වෙඩි වාහනයට වදින්නට ඇති බව තමාට සිතුනු බවත්, වීදුරු බිඳෙන හඬ තමාට ඇසුණු බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. වෙඩි තැබීම සිදුකරන අවස්ථාවේදී වෑන් රථයෙන් පැමිණ වෙඩි තබන ලද පිරිස පාතාලයේ කිසියම් පිරිසක් බවත් දේපල කොල්ලකෑම හෝ කප්පම් ගැනීම වැනි සිදුවීමකට පැමිණි පිරිසක් බවට තමාට සිතුණු බවත් වෑන් රථය තමන් පසුකර යන අවස්ථාවේදී ඔවුන් තමාටද ප්‍රහාරයක් එල්ල කරනු ඇතැයි බයක් දැණුනු බවටත් පසුව ජීප් රථයෙන් කිලෝ මීටර් 05 ක් 06 ක් පමන පසුපස හඹායාමක් සිදු කරනු ලැබූවද පලායාම සිදු කරන ලද වෑන් රථය අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ බවටත් වැඩිදුර සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

03 MAR 2025

ස්ථානීය මහේස්ත්‍රාත් පරීක්ෂණයට අදාලව සහ ස්ථානීය අපරාධ විමර්ශන නිලධාරීන්ගේ නිරීක්ෂණයට අදාලවද රජයේ රස පරීක්ෂකවරයාගේ නිරීක්ෂණ අදාලවද වෙඩි වැදීමට ලක්වූ වෑන් රථයේ ගිණි අවි උණ්ඩ වැදීම සිදුවූ බවට නිගමනය කලහැකි ගැටීම් සලකුණු කිහිපයක් නිරීක්ෂණය වී ඇත. ස්ථාන පරීක්ෂණයේදී අංක 14 ලෙස සලකුණු කර පරීක්ෂණයට ලක්කල වෑන් රථයේ වෙඩි වැදීම් සලකුණු මහේස්ත්‍රාත්වරයා විසින් නිරීක්ෂණය කර ඇත. එම වෑන් රථය සහ එහි අඩංගු සිදුරු සහ පළුදු ඇති වීම්ද සොයා ගන්නා ලද උණ්ඩ කොටස්ද විශ්ලේෂණය කරමින් වාර්තාවක් සිය විශේෂඥ මතය සහිතව 2024.03.26 දිනැතිව ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයා සහ ආන්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකගේ අත්සනින් ඉදිරිපත්ව නඩු ගොනුවට ගොනුවී ඇත. එකී වාර්තාවේ අංක 08 යටතේ වෑන් රථය වෙත තිබෙන සිදුරු සහිත පළුදු වල ස්වභාවය සහ පළුදු වලට අදාල ගමන් පථ සසඳමින් වෙඩි තැබීම පිළිබඳව සිය විශේෂඥ මතය රස පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කර ඇත. උණ්ඩ කොටස්, ගිනි අවිය සහ වෙඩි උණ්ඩ වෑන් රථයට එල්ලවී ඇති දිශානතීන් පිළිබඳ සියළුම කරුණු සලකා බැලීමේදී අධිකරණයට එළඹිය හැකි නිගමනය වන්නේ සාක්ෂි අංක 2 සාක්ෂිකරු වන යුධ හමුදා සැරයන් රුවිරංග නිලධාරියා විසින් නවතා තිබූ ජීප් රථයේ දකුණු පස අසුනේ සිට විවෘතව තිබූ ජනේලය තුලින් ගිණි අවිය යොමුකර ජීප් රිය ඉස්සරකර එහි දකුණු පසින් ගමන් කරමින් සිටි වෑන් රථයට තබන ලද වෙඩි ප්‍රහාර මගින් වෑන් රථයේ අදාල සිදුරු සහිත පළුදු සහ ගැටීම් ප්‍රතිඵලයන් ඇතිවී තිබෙන බවයි. එහි රස පරීක්ෂක වාර්තාවේ 8(v)(a) සිට (d) දක්වා නිගමනය අනුව සලකා බැලීමේදී වෑන් රථයට

03 MAR 2025

වම් පසින් එල්ල කල වෙඩි පහරක් මගින් එකී ප්‍රතිඵලය උද්ගතවී ඇති බව රස පරීක්ෂකවරයාගේ නිගමනය වී ඇත. එය සෙසු නිරීක්ෂණ සළකා බැලීමේදී වෑන් රථයේ වම්පස සිට පිටුපස ප්‍රදේශයට විහිද ගිය වෙඩි වැදීමක් නිරීක්ෂණය වී ඇත. එමෙන්ම එහි 09 වන නිගමනය අනුව රස පරීග්ෂකවරයාගේ මතය වී ඇත්තේ වෑන් රථය මත වාර්තාවේ සඳහන් කර ඇති ලෝහමය පෘශ්ඨය මත වන සිදුරු සහිත පළුදු වල පසාරු වීමේ ස්වභාවය සැලකීමේදී එම පළුදු රැලි කානු සහිත ගිණිඅවියක්/අවි මගින් වෙඩි තැබීමේදී නිකුත් වන උණ්ඩ අදාල පෘශ්ඨ මත ගැටීමෙන් හටගත් පළුදු වන බවයි. මරණකරුගේ භෞතික මෘත ශරීරය සිය පරීක්ෂණයට ලක්කල උගත් ගාල්ල අතිරේක මහේස්ත්‍රාත්වරයා විසින් මරණකරුගේ ශරීරයේ වම් උරහිසේ සිට පපුව දෙසට අඟල් 05 ක් පහලින් කුඩා සිදුරක් ලෙස පවතින තුවාලයක්ද වම් පාදයේ දණහිසේ සිට අඟල් 03 ක් පමන ඉහලින් 10CM X 07 CM ප්‍රමාණයේ තුවාලයක්ද නිරීක්ෂණය කර ඇත. පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලද අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සිය පශ්චාත් මරණ පරීක්ෂණයේදී රයිෆල් ගිණි අවියකින් සිදුවූ වෙඩි තැබීම් තුවාල දෙකක් මරණකරුගේ ශරීරයෙන් හඳුනා ගෙන ඇත. පළමු තුවාලය ලෙස මරණකරුගේ ශරීරයේ පිටුපසින් ඇතුළුවීමේ විවරය සහිතව වම් පෙනහැල්ලට හානි සිදුකරමින් ශරීරය ඉදිරිපසින් පිටව ගිය වෙඩි උන්ඩයක් මගින් සිදුකල තුවාලයක්ද දෙවන තුවාලය ලෙසට මරණකරුගේ වම් පාදයේ දනහිසට ආසන්නව ඉහලින් ඇතුළුවීමේ සහ පිටවීමේ තුවාල සලකුණු දෙකක් සහිත ගිණි අවියකින් පිටවූ උන්ඩයක් මගින් ඇතිකල තුවාලයක්ද එලෙස හඳුනාගෙන ඇති අතර පෙනහැල්ලට සිදුවූ තුවාලය මරණීය ප්‍රතිඵලය ඇතිකල තුවාලය ( Fatal

Injury ) ලෙසද නියගමනය කර ඇත. ඒ අනුව සියළුම කරුණු සලකා බැලීමෙන් අනතුරු අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ නිගමනය වී ඇත්තේ මරණයට බලපාන ලද වෛද්‍ය විද්‍යාත්මක හේතුව රයිෆල් ගිණි අවියකින් සිදුවූ තුවාල හේතුවෙන් සිදුවූ වම් උරස්කුහරයට රුධිරය සහ තරලය වාතය සමග පාර්ශවිය ලෙසට පිරීයාමෙන් ඇතිවූ සංකූලතාවයක් බවයි. ඒ අනුව ඉහත සලකා බලමින් අගය කරන ලද සියළුම සාක්ෂි, කරුණු සහ නිගමනයන් පදනම් කරගනිමින් මෙම නඩුවේ විශයගත සිදුවීමේදී මරණයට පත්වූ මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර යන අයගේ මරණයට අදාල දෘශ්‍යමාන හේතුව රයිෆල් ගිණිඅවියකින් සිදුකල වෙඩිතැබීම් තුවාල හේතුවෙන් හටගත් හිමෝප්පෙනියුමොතොරෙක්සිය( Hemopneumothorax due to rifile firearm injury) හෙවත් උරස් කුහරයට රුධිරය සහ තරලය සමග වාතය පාර්ශවීය ලෙස පරියාමෙන් ඇති වන සංකූලතා තත්වය බවට නිගමනය කරමි. ඒ අනුව එම හේතුව සඳහන් මරණ සහතිකයක් මරණකරුගේ ඥාතීන්ට නිකුත් කරන ලෙසට අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට නියම කරමි.

මෙම නඩුවට අදාලව මහේස්ත්‍රාත් අධිකරණය සතු දෙවන නෛතික වගකීම වන්නේ පවත්වන ලද පරීක්ෂණය පදනම් කරගෙන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 138 සහ 139 වන වගන්ති යටතේ කටයුතු කිරීමට තරම් හේතු පවතින්නේද යන්න නිගමනය කර උචිත අධිකරණ නියෝගයක් සිදු කිරීමයි. එම වගන්ති දෙක මගින් පහත නෛතික ප්‍රතිපාදන සලසයි.

**"138. (1)**

03 MAR 2025

136(1)(අ) වන වගන්තිය යටතේ හෝ 136 (1) (ආ) වන වගන්තිය යටතේ හෝ පවරනු ලැබූ යම් නඩු කටයුතු වල කරන ලැදැයි කියනු ලබන වරද තමා විසින් ලඝු ආකාරයෙන් විභාග කළ නොහැකි වරදක් වන අවස්ථාවක, එවැනි වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙකු නමින් චෝදනා ලැබ නොමැති වුවද චෝදනාකරු හෝ දැනුම් දෙන්නා ද නඩුවේ සිද්ධි සම්බන්ධයෙන් තොරතුරු දන්නේ යැයි මහේස්ත්‍රාත්වරයාට පෙනී යන වෙනත් යම් තැනැත්තෙකුද මහේස්ත්‍රාත්වරයා විසින් දිවුරුම් පිට විභාග කරනු ලැබිය හැකිය. සුදුසු යැයි මහේස්ත්‍රාත්වරයා කල්පනා කරන්නේ නම්, ඒ විභාගය අප්‍රසිද්ධියේ පවත්වනු ලැබිය හැකිය.

(2) මහේස්ත්‍රාත්වරයා විසින් (1) වන උප වගන්තිය යටතේ පවත්වනු ලබන සෑම විභාගයක්ම ලිඛිතව පිලියෙළ කොට එය කියවා දෙනු ලැබීමෙන් පසු හා අවශ්‍ය වුවහොත්, විභාග කරනු ලැබූ තැනැත්තාට භාෂණ පරිවර්තනය කර දීමෙන් පසු ඔහු විසින්ද මහේස්ත්‍රාත්වරයා විසින් ද අත්සන් කරනු ලබ, දිනය යොදනු ලැබිය යුතුය.

(3) එවැනි විභාගයකින් පසු, යම් තැනැත්තෙකුට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් , 139 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට විරුද්ධව අධිකරණ නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතුය."

"139. (1) 136 (1) වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නඩු පවරා ඇත්තා වූද අත්අඩංගුවේ නොමැති යම් තැනැත්තෙකුට විරුද්ධව කටයුතු කරගෙන යෑම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන්නා වූද අවස්ථාවක.

(අ) නඩුව, පළමුවන උප ලේඛනයේ 4 වන තීරය අනුව පළමුකොට සිතාසියක් නිකුත් කල යුතු නඩුවක් නම්, ඒ තැනැත්තා පැමිණ සිටීම සඳහා වූ සිතාසියක් ඔහු විසින්, 63 වන වගන්තියේ විධිවාධාන වලට යටත්ව, නිකුත් කරනු ලැබිය යුතුය:

(ආ) නඩුව, එම තීරය අනුව පළමුකොට වරෙන්තුවක් නිකුත් කළ යුතු නඩුවක් නම්, නියමිත වේලාවකදී ඒ තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙන එනු ලැබීමට හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට හෝ සැලැස්වීම සඳහා වරෙන්තුවක් ඔහු විසින් නිකුත් කරනු ලැබිය යුතුය :"

ඒ අනුව එම වගන්ති 136(1)(ආ) වගන්තිය සමග සලකා බැලීමෙන් පසුව අධිකරණය එළඹෙන නිගමනය වන්නේ එකී 136(1)(ආ) වගන්තිය ප්‍රකාරව වැලිගම පොලිස් ස්ථානාධිපති ඉදිරිපත් කරන ලද ලිඛිත වාර්තාව මගින් අනාවරණය කරන ලද කරුණු මත අධිකරණය විසින් පවත්වන ලද පරීක්ෂණය අනුව යම් තැනැත්තෙකුට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම් පනත මගින් නියම කරන ලද ඉදිරි නෛතික ක්‍රියාමාර්ග ගතයුතු බවයි. 138 වගන්තිය මගින් යම් තැනැත්තෙකුට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් හේතු තිබේද යන්න පිලිබඳව මතයකට එළඹීමට පරීක්ෂණය මත පදනම්ව අභිමතානුසාරී බලයක් මහේස්ත්‍රාත් අධිකරණයට හිමිකරදී ඇත. විමර්ශන පදනම්ව නඩුවට අදාලව සැකකරුවකු නිශ්චිතව නම්කර නොමැති අවස්ථානුගත තත්වයකදී වුවද මෙම නෛතික ප්‍රතිපාදනය එවැන්නක් සිදුකිරීම සඳහා පුළුල් බලයක් මහේස්ත්‍රාත් අධිකරණයට පවරා ඇති බව අධිකරණයේ නිගමනයයි. මෙම නෛතික බලයේ සීමාවන් මොනවාද යන්න සහ නීතියේ පදනම මත එකී අභිමතානුසාරී බලය ක්‍රියාවේ යෙදවිය යුත්තේ කෙසේද යන්න අධිකරණය මගින් මුලින්ම සලකා බැලිය යුතු තත්වයකි. අපරාධ නඩුවකදී මහේස්ත්‍රාත්වරයා අධිකරණමය කාර්යයක් ඉටු කරන බවත්, විධායකයේ කොටසක් වශයෙන් සිටින විමර්ශකයන්ගේ කොටසක්ව නොපවතින බවත් මූලික නෛතික සිද්ධාන්තයකි. එසේ වුවද ශ්‍රී ලංකාව තුල ස්ථාපිතව ඇති නෛතික තත්වය අනුව අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී යුක්තිය සහ සාධාරණත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා අපරාධ නඩුවක විමර්ශන

03 MAR 2025
Adheesha Ariyathilaka

අධියරයේදී, මහේස්ත්‍රාත්වරයෙකු යුක්තිය සහ සාධාරණත්වය, විමර්ශනයට අදාලව සහතික කිරීමටත්, යුක්තිය ඉටුවීම පිළිබඳ සැකකරුගේ සහ වින්දිතයාගේ යන දෙපාර්ශවයේම අයිතිවාසිකම් සනාථ කිරීම සඳහාද, යුක්තිය ඉටුවන බව පමණක් නොව ඉටුවන බව පෙනෙන්නටද තිබිය යුතු බවට වන නීතිමය සංකල්පය අනුව යමින් සමස්ථ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ විශ්වාසනීයත්වය සහ ප්‍රතිඵලදායකත්වය සාක්ෂාත් කරගැනීම සඳහාද විමර්ශන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ සහ සුපරීක්ෂාකාරීවීමේ ඉහල අධිකරණමය වගකීමක් මහේස්ත්‍රාත්වරයා දරන බව තහවුරුවී ඇති නෛතික තත්වයකි. 1998(1) SLR 340 යටතේ වාර්තාගතවී ඇති <u>Victor Ivan Vs. Sarath N.Silva</u> නඩුකරයේදී එම තත්වය

> **"A Citizen is entitled to a proper investigation – one which is fair, competent, timely and appropriate – of a criminal complaint, whether if bely him or against him. The criminal law exists for the protection of his rights – of person, property and reputation – and lack of a due investigation will deprive him of the protection of the law"**

ලෙස තීරණය වී ඇත. ඒ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ නීතියෙන් නිගමනය කර ඇති නෛතික ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින්ද සාධාරණ නඩු විභාගයක් පිළිබඳ සංකල්පයට ඇතුලත් සැකකරුවකුගේ අයිතිවාසිකම් මෙන්ම අපරාධය පිළිබඳ යුක්තිය අයදින වින්දිතයන් සහ සෙසු සියළු පාර්ශවයන්ගේ අයිතිවාසිකම්ද, නීතියේ ආධිපත්‍යය සහ සාමය ස්ථාපිත කිරීම සඳහා ජනතාව විසින් පරමාධිපත්‍ය බලය යටතේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ සෙසු නීති මගින් පවරා දී ඇති

බලයේ පරමාර්ථයන්ද එකම පොදු ස්ථානයකදී සලකා බලන්නෙකු ලෙසට එම අවශ්‍යතා අතර ගැටීම් තුලනය කරමින් නීත්‍යානුකූල, යුක්තිගරුක සහ සාධාරණ ප්‍රතිඵලයක් නිර්මානය වීම දක්වා විමර්ශකයින්ගේ විමර්ශනය නිසි මාර්ගයේ පවත්වාගෙන යන්නේද යන්න පිලිබඳව අධිකරණමය ලෙස මැදිහත්වීමක් සහ සුපරීක්ෂණයක් පැවැත්වීමට මහේස්ත්‍රාත් අධිකරණයට පුළුල් බලයක් ශ්‍රී ලංකාවේ නීතිය මගින් ලබාදී ඇති බවයි. මෙම අවස්ථාවේදී ඉහත සලකා බලන ලද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 138 වගන්තිය මෙන්ම 120 වගන්තියද ඒ සම්බන්ධයෙන් වඩාත් පුළුල් බලයක් මහේස්ත්‍රාත් අධිකරණය වෙත පවරා දී ඇත. මහේස්ත්‍රාත්වරයෙකුගේ මෙම අධිකරණමය මනසින් කරනු ලබන සුපරීක්ෂණ මැදිහත්වීම සනාථ කරන තීරනාත්මක නෛතික ප්‍රතිපාදන දෙකක් වන්නේ පනතේ 119 වන වගන්තිය සහ 120 වගන්තිය මගින් පවරා ඇති බලතලයි. 119 වගන්තිය ප්‍රකාශිතව යම් විමර්ශකයෙකු විසින් විමර්ශනයට භාජනය කරනු ලබන යම් වරදක් පිලිබඳ විමර්ශන කාර්යය ඒ පරීක්ෂකවරයාගෙන් ඕනෑම අවස්ථාවකදී ඉවත් කර එය තමා විසින්ම පරීක්ෂණයට, නඩු විභාග කිරීමට හෝ නඩු විභාගයන් පිණිස ඉදිරිපත් කිරීමට මහේස්ත්‍රාත්වරයෙකුට බලය සපයයි. 120 වගන්තිය ප්‍රකාශිත ප්‍රතිපාදන මගින් සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් සුපරීක්ෂණ බලයක් සපයයි.

අපරාධ නීතිය පිලිබඳ කීර්තිමත් විද්වතෙකු වන ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා විසින් ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ සංගමයේ වාර්ශික අධ්‍යයන ප්‍රකාශනයක් වන JSA Law Journal 2024 Volume XI සඳහා සම්පාදිත "The

03 MAR 2025

role of the magistrate in ensuring a fair and efficient investigation"

අධ්‍යයන රචනයේ මෙම තත්වය මෙලෙස ප්‍රකාශ කරයි.

> **"A Criminal investigation is Crucial before prosecuting a case. Investigators, part of the executive branch, are given extensive power by law and judicial interpretation. In Sri Lanka's adversarial system, the trial Judge acts as an umpire. However, during the course of an investigation, the magistrate should not act as a mere Umpire or silent observer, but is duty-bound to see that a fair, efficient and independent investigation is conducted in a timely manner, though he is not in charge of the investigation"**

මෙම සිය ස්ථාවරය සනාථ කිරීම සඳහා සම්පාදකයා විසින් SC FR Application No 207/2016, SC minutes of 11.07.2016 of page 03 හි සඳහන්ව ඇති Udaya Gammanpila Vs MDCP Gunathilake IP SIV and others නඩුවේදී ගරු ශ්‍රීපවන් අගවිනිසුරු තුමන් විසින් ප්‍රකාශිත

> **"When a "B" Report is filed, the Magistrate has to apply his judicial mined to the said report and give appropriate directions to the Police if further Investigations are necessary"**

නෛතික තත්වයද උපුටා දක්වා ඇත. වැඩිදුරටත් එම රචකයා විසින්ම SE TAB 1A and 1B/2020 SC minutes of 11.01.2023 හි වාර්තාගතව ඇති Kusumdasa Mahanama Vs. CIA BOC නඩු තීන්දු උපුටා දක්වමින් අපරාධ විමර්ශනයක විධිමත්භාවය පිළිබඳව ඇති අත්හල නොහැකි වගකීම අවධාරණය කරයි. එම නඩු තීන්දුවේ ඒ සම්බන්ධයෙන් පහත කරුණු දක්වයි.

**"Not only should a criminal investigation be lawful, if must be fair as well; fair from the perspective of both the victim of Crime and the Suspected Perpetrator of the offence. By the conduct of an unfair investigation, there is every reason to belive that the truth will not surface, and in the Circumstances, the public will lost confidence in criminal law enforcement and in the criminal justice system"**

වැඩිදුරටත් එම නඩු තීන්දුව මගින් තීරණය කර ඇති තත්වය වන්නේ සැකකරුවෙකුට නීතියෙන් හිමි අයිතිවාසිකම් සාධාරණ නඩු විභාගයක දෘශ්ටියෙන් තහවුරු වීමත්, විමර්ශකයන් විසින් සත්‍යය යටපත් කිරීමෙන් අපරාධ යුක්තිය පසිඳලීම් ක්‍රියාවලිය පිලිබඳ පවතින විශ්වාසය පළුදු නොවන ලෙසත්, විමර්ශනයේ අරමුණු පැවතිය යුතු බවයි. එම සියළු කරුණු සලකා බලමින් අධිකරණය විසින් 138 වගන්තිය ප්‍රකාරව පවරා ඇති අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කලයුතු බව ඒ අනුව එළඹෙන නිගමනයයි.

යම් තැනැත්තෙකු විසින් කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් පවතින තත්වයකට අදාලව එම ක්‍රියාව කල තැනැත්තාට අපරාධ වගකීම පැවරීම සම්බන්ධයෙන් වන නෛතික තත්වය ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය තුල සලකා බැලෙන ආකාරයද මෙහිදී තීරණාත්මක වැදගත්කමක් උසුලයි. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය අනුව අපරාධ වරදක් වශයෙන් පැවතිය හැක්කේ වරදක් ( Offence) වශයෙන් නීතිය මගින් ව්‍යවස්ථාපිතව සම්මත කරන ලද යම් ක්‍රියාවක් ( Act ) හෝ නොකරහැරීමක් ( Ommition ) පමනි. එසේ හෙයින් යම් තැනැත්තෙකුගේ ක්‍රියාවක් හෝ නොකරහැරීම නීතිය විසින් අපරාධ වරදක් ලෙසට ව්‍යවස්ථාපිතව පනවා තිබේද යන්න සලකා බැලිය යුතු කරුණ වේ.

03 MAR 2025

එලෙස යම් තැනැත්තෙකු විසින් සිදු කරන ලද ක්‍රියාවන් ව්‍යවස්ථාපිත නීතිය මගින් වරදක් බවට පමුණුවා ඇති අවස්ථාවකදී එම වරද පිලිබඳව අධිකරණමය වශයෙන් නිගමනයට එළඹීමේදී අධිකරණය විසින් සාක්ෂිමත පදනම්ව නිගමනය කලයුතු කරුණක් වනුයේ එකී ව්‍යවස්ථාපිත නීතියේ පනවන ලද අපරාධ වැරදි වල ඔප්පු කල යුතු අපරාධ සංඝටක මොනවාද යන්නයි. නෛතික අර්ථය අනුව අපරාධ වරදක් සම්බන්ධයෙන් වන ඔප්පු කලයුතු සංඝටක ආකාර දෙකකින් සමන්විත වන අතර එනම් අපරාධමය ප්‍රතිඵලය ජනනය කරනු ලබන ක්‍රියාව හෝ නොකරහැරීම ඇතුලත් අපරාධ වරදේ ශාරීරික අංගය හෙවත් Actus reus සහ අපරාධ ප්‍රතිඵලය හා බැඳී පවතින වරදක් කිරීමේ සාවද්‍ය මනස හෙවත් මානසික අංගය Mens rea යන අංග දෙකයි. චෝදනා පත්‍රයක් වන නඩු විභාගයක් පවත්වා වූදිත එකී වරද සම්බන්ධයෙන් වරදකරුද නොඑසේනම් නිවැරදිකරුද යන්න තීරණය කරනු ලබන විනිසුරුවරයෙකු හෝ ජූරි සභාවක් විසින් අදාල අපරාධ සංඝටක සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුවී තිබේද යන ඉහල මට්ටමේ සාක්ෂිමය ඔප්පු කිරීමක් සිය නිගමනයට එළඹීමේදී සලකා බලයි. මෙම නඩුකරය එවැනි චෝදනා පත්‍රයක් මත පවත්වනු ලබන විභාගයක් නොවන බැවින්ද, 138(3) වගන්තියට යොමුව කරනු ලබන සිදුවීමේ ප්‍රතිඵලය වශයෙන් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට එරෙහිව නඩුකරයක් ඉදිරියට පවත්වාගෙන යාමට තරම් මහේස්ත්‍රාත්වරයාට සෑහීමට පත්විය හැකි මට්ටමේ කරුණු /හේතු පවතින්නේද යන්න සලකා බැලෙන පරීක්ෂණයක් බැවින්ද අපරාධ සංඝටක සාක්ෂි මත සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුවී තිබේද යන්න සලකා නොබලන අතර, යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැරදි

සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේද යන්න තීරණය කරමින් තීන්දුවක් (Verdict) ප්‍රකාශයට පත් නොකරයි. මෙම නඩුවට අදාලව මහේස්ත්‍රාත් අධිකරණයේ වගකීම වන්නේ තමා ඉදිරියේ ඇති කරුණු අනුව 138(3) වගන්තිය නෛතික සීමාවට ඇතුලත්ව සිය අභිමතානුශාරී බලය ක්‍රියාත්මක කරමින් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට එරෙහිව නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට තරම් තත්වයක් පවතින්නේද යන්න සලකා බලා නියෝගයක් සිදු කිරීමයි. මෙම නඩුවට අදාලව සමස්ථ කරුණු සලකා බැලීම මා විසින් සිදු කරනු ලබන්නේ එම නෛතික වගකීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාලව බව මූලික නිගමනය කරමි.

මෙම නඩුවට පාදක වූ සිදුවීමේදී මරණයට පත් වූ මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර නැමති පොලිස් සැරයන් 57241 දරන නිලධාරියාගේ මරණය රයිෆල් වෙඩි පහරවල් හේතුවෙන් වම් පෙනහැල්ලට සිදුවූ තුවාලයක් හේතුවෙන් වම් උරස් කුහරය තුලට රුධිරය සහ තරලය ඒකරාශීවීමෙන් ඇතිවූ Hemopaeumothorax නැමති සංකූලතා තත්වය බවට ඉහත හේතු ප්‍රකාශ කර ඇත. ඒ අනුව අධිකරණය විසින් මෙම පරීක්ෂණයට අදාලව තවදුරටත් තීරණය කල යුත්තේ එකී මරණය සම්බන්ධයෙන් සහ එම මරණය ප්‍රතිඵලය වූ සිද්ධිය තුලින් අපරාධ වගකීමක් පැවරීමට සහ/හෝ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 138 වගන්තියේ ප්‍රතිපාදන අනුව යම් තැනැත්තෙකුට එරෙහිව නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් නෛතික තත්වයක් පවතින්නේද යන්නයි. එකී මරණකරුගේ මරණයට අදාලව හේතුව වූ රයිෆල් වෙඩි පහර එල්ල කරන ලද්දේ යම් තැනැත්තෙක්ද යන්නත්, එම ක්‍රියාවට වගකිවයුත්තේ

සහ අපරාධ වගකීමට කවරකු හෝ තැනැත්තන් යටත්වීමක් සිදුවිය යුත්තේද යන්න මෙහිදී අධිකරණය විසින් සලකා බලා තීරණය කලයුතු කරුණකි.

මෙම නඩුවට පදනම ලෙස පවතින ඉහත නම් සඳහන් මරණකරුගේ මරණය දක්වාම විහිදීගිය ප්‍රතිඵලය ප්‍රධාන සිදුවීම් දෙකක් හරහා උත්පාදනය වී ඇති බව නිරීක්ෂණය වේ. ඉන් පළමු සිදුවීම වන්නේ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් WPPK-7225 දරන සුදු පැහැති ටොයෝටා KDH වර්ගයේ රථයක නැගී පැමිණි පො.කො.රි 89728 දුලිප් නිලධාරියා විසින් පදවන ලද සහ සෙසු නිලධාරීන් ලෙසට කොළඹ අපරාධ කොට්ඨාශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලම්ද සිල්වා, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, පො.ප. ආර්. සුදුසිංහ, උප පොලිස් පරීක්ෂක මධුරංග, පො.සැ.57241 උපුල්, පෙ.සැ.69480 කුමාර, පො.කො.2204 ප්‍රියෂාන් යන නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් මාතර වැලිගම පැලැන වටරවුම අසල මාතර - කොළඹ ප්‍රධාන මාර්ගයට යාබදව මුහුද දෙසට පිහිටා ඇති "W15" හෝටලය ඉදිරිපිටදී වර්ෂ 2023.12.31 දින අළුයම පැය 0230 ට පමණ එම හෝටලය දෙසට වෙඩි ප්‍රහාරයක් එල්ල කිරීමේ සිදුවීමයි. දෙවන සිදුවීම වනුයේ එම පළමු සිදුවීම සිදුවන නිශ්චිත වේලාවේදීම තම රාජකාරි රාත්‍රී ජංගම සංචාරයේ යෙදෙමින් සිටි වැලිගම පොලිසියේ නිලධාරීන් තිදෙනෙකු සහ එම කන්ඩායමට අනුයුක්ත කර සිටි යුධ හමුදා සෙබලුන් දෙදෙනෙකුගෙන්ද සමන්විත වැලිගම පොලිසියට අයත් WPGC-0320 දරන ජීප් රථයේ ගමන්කල නිලධාරීන් පිරිසක් පෙර පළමු සිදුවීම සම්බන්ධව WPPK-7225 දරන එම පිරිස සිට වූ රථයට වෙඩිතැබීමේ සිදුවීමයි.

03 MAR 2025

ඒ අනුව අධිකරණය මූලිකව තීරණය කල යුත්තේ මරණයට පත්වූ උපුල් නිලධාරියාට මරණීය තුවාලය ඇති කරන ලද වෙඩි තැබීම සිදු කරන ලද්දේ කවර තැනැත්තෙකු විසින්ද යන බවයි. මෙම කරුණ නිශ්චය කිරීමට අදාලව මෙම පරීක්ෂණයට මෙහෙයවන ලද සියළුම සාක්ෂිද, අධිකරණ වෛද්‍ය වාර්ථා සහ රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්ථාවද සැලකිල්ලට ගනිමි.

පළමු සිදුවීමට එනම් "W15" හෝටලය දෙසට වෙඩි තැබීමේ සිදුවීමට අදාල WPPK-7225 රථයේ ගමන් කල නිලධාරීන් අතරින් දැනට ජීවත්ව සිටින නිලධාරීන් 07 දෙනාගේ ස්ථාවරය වී ඇත්තේ සිදුවීම වන අවස්ථාවේදී වැඩබලන පොලිස්පති ධූරයේ කටයුතු කල බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අන සහ නියෝගයද, සෘජු අධීක්ෂණයද යටතේ දකුණු පළාත තුල ක්‍රියාත්මක හරක්කටා නොහොත් නදුන් චින්තක වික්‍රමරත්න යන සංවිධානාත්මක අපරාධකරුගේ සමීපතමයින් වශයෙන් සිටින සැකකරුවන් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් ලැබී තිබූ තොරතුරු කිහිපයක් මත ඒ සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා වැලිගම, මිරිස්ස, මිදිගම ප්‍රදේශ වල සංචාරය කරමින් 2023.12.31 දින අළුයම් කාලයේදී ගමන් කල වෑන් රථය මාතර දෙස සිට ගාල්ල දෙසට ගමන් කරමින් සිටියදී පැලෑන "W15" හෝටලය අසල සැක සහිත පුද්ගලයෙකු ගමන් බෑගයක් සහිතව සිටිනවා දැක ඒ සම්බන්ධයෙන් වෑන් රථයේ සිටි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලම්ද සිල්වා නිලධාරියාද දැනුවත් කිරීමෙන් පසුව වෑන් රථයේ වම්පස දොර අසල වාඩිවී සිටි උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා එම දොර විවෘත කර සැකකරු අත්අඩංගුවට ගැනීමට උත්සාහ කිරීමේදී යාබද

03 MAR 2025

නෙප්චූන් හෝටලය පිහිටි දිශාවට දිවගිය බවත් එම පුද්ගලයා පලාගිය දෙස සිට වෙඩි ප්‍රහාරයක් වෑන් රථයට එල්ල වූ බවත් ප්‍රතිප්‍රහාරයක් වශයෙන් උ.පො.ප.මධුරංග නිලධාරියා වෙඩි තැබීමක් සිදු කල බවත්, එහිදී ස්ථානාධිපතිවරයා වෑන් රථයේ රියදුරුට වෑන් රථය ඉදිරියට පදවන ලෙසට උපදෙස් දුන් බවත්, පොලිස් ජීප් රථයක් එහි තිබෙනු නොදුටු බවත් සහ තුවාලකරු ගාල්ල කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමට රැගෙන යමින් සිටියදී ඉමදූව අධිවේගී පිවිසුමේ රාජකාරි කල පොලිස් නිලධාරීන් තමන්ට ගමන් කිරීමට අවසර ලබා නොදී රඳවාගත් බවත්ය. එම වෑන් රථයේ ගමන් කල නිලධාරීන්ගේ සාක්ෂි අනුව ස්ථාවරය වී ඇත්තේ පැමිණ තිබූ වෑන් රථයේ පිටුපස ප්‍රදේශයට එල්ල කරන ලද හඳුනා නොගත් පුද්ගලයකුගේ වෙඩි ප්‍රහාරයක් හේතුවෙන් වෑන් රථයේ ගමන්කල උපුල් නිලධාරියා මරණයට පත්වූ බව සහ උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා තුවාල ලැබූ බවයි.

WPGC-0320 දරන රාත්‍රී ජංගම පොලිස් සංචාරයේ නිරතව සිටි නිලධාරීන්ගේ සාක්ෂි සලකා බැලීමේ දීඑළඹිය හැකි නිගමනය වන්නේ මාතර දෙස සිට ගාල්ල දෙසට රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටියදී පැලැන "W15" හෝටලය ඉදිරිපිට නවතා තිබූ සුදු පැහැති වෑන් රථයක් තුල සිට එම "W15" හෝටලය දෙසට පුද්ගලයෙකු වෙඩි තබන ආකාරය නිරීක්ෂණය වීමෙන් අනතුරුව, එම පිරිස දකුණු පළාත තුල ක්‍රියාත්මක අවිගත් කැරලිකාර කන්ඩායමක් බව තීරණය කර ගිණි අවි භාවිතා කර වෙඩිතැබීම මගින් ඇතිවිය හැකි ජීවිත සහ දේපල හානි වැලැක්වීමට කන්ඩායම්භාර නිලධාරී පො.සැ.16829 ඉමදූව මානගේ අජිත් සිසිර කුමාර යන අයගේ නියෝග මත ජීප්

රථය තුල සිටි යුධ හමුදා සැරයන් 02725 චන්දිමාල් රුවිරංග යන අය විසින් ජීප් රථය එහි දකුණු පසින් ඉස්සර කරමින් පසුකර යන වෑන් රථයට ටී.56 වර්ගයේ ගිණි අවියක් භාවිත කරමින් රථය තුල සිටම වෙඩි තැබූ බවට ස්ථාවරයක් ඉදිරිපත් කර ඇති බවයි.

එසේ හෙයින් මෙම කියාපෑම් දෙකම එකවර සත්‍ය විය නොහැකි බව අධිකරණයට සාක්ෂිමත පෙනියන තත්වය වේ. සිදුවීම සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති සියළුම සාක්ෂි, කරුණු සහ වාර්තා සලකා බලමින් එම මරණකරුගේ මරණය දක්වා බලපැවැත්වුණු වෙඩිතැබීම වෑන් රථයේ පැමිණි පිරිස ප්‍රකාශ කරන ආකාරයට වෑන් රථය නවතා තිබියදී එහි පිටුපසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කල නාඳුනන තුවක්කුකරුවෙකුගේ ක්‍රියාවක් තුලින් සිදුවූවක්ද නොඑසේනම් පොලිස් ජංගම සංචාරක රථය තුල සිට යුධ හමුදා සැරයන් රුවිරංග විසින් එල්ල කල වෙඩි ප්‍රහාරවල ප්‍රතිඵලයක් හේතුවෙන් සිදුවූවක්ද යන්න අධිකරණය විසින් තීරණය කල යුතුව ඇත.

මේ සම්බන්ධයෙන් මුල් විමර්ශනය සිදු කල වැලිගම පොලීසිය විසින් මුල් අදියරේදී විමර්ෂණ මෙහෙයවීම සහ අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදුකර ඇත. පොලිස්පතිවරයාට අපරාධ නඩු විධාන සංග්‍රහ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී විමර්ශන කටයුතු වැලිගම පොලීසියෙන් ඉවත් කර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති අතර, ඒ අනුව වර්ෂ 2024.10.22 දින සිට එකී විමර්ශණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවා ඇත. 2024.12.05. දිනැති තොරතුරු වාර්ථාවේ 05 ඡේදය මගින් WPPK-7225 වෑන් රථයේ පැමිණි පිරිස විසින් ප්‍රකාශ කරන ආකාරයට

"W15" හෝටලයේ සිට මාතර දෙසට පිහිටි නෙප්චූන් හෝටලය දෙස සිට නාඳුනන පුද්ගලයෙකු වෑන් රථයට වෙඩි තබන ලද බවත් විමර්ශනයේදී අනාවරණය වී නොමැති බව වාර්තා කර ඇත. "W15" හෝටලයට වෙඩි ප්‍රහාරයක් එල්ල වීම නෙප්චූන් හෝටලය දෙස සිට කල වෙඩි ප්‍රහාරයට එල්ල කල ප්‍රතිප්‍රහාරයක් වශයෙන් සිදුවිය නොහැක්කක් බවද විමර්ශන නිලධාරීන් අධිකරණයට වාර්තා කර ඇති ස්ථාවරයයි. මෙම නඩුවට ඉදිරිපත් වී ඇති සාක්ෂි ගණනාවක් මගින්ම මෙම විමර්ශන නිගමනය සාක්ෂිමය ලෙස සනාථ වන බව අධිකරණය එළඹෙනු ලබන නිගමනයයි. පරීක්ෂණයේදී අංක 05 සාක්ෂිකරු ලෙසට සාක්ෂි ලබාදුන් "W15" හෝටලයේ ආරක්ෂක නිලධාරීන්ගේ සාක්ෂිය අනුව 2024.12.31 දින අළුයම හෝටලයේ ගේට්ටුව ඉදිරිපිට නතර කරන ලද මෙම වෑන් රථය පළමු අවස්ථාවේදී නිරීක්ෂනය කර ඇත. එම පළමු අවස්ථාවේදී හෝටලය දෙස සිට වෑන් රථය දෙසට ගොස් හස්ත සංඥාවකින් වාහනය හෝටලයට පැමිණි වාහනයක්ද යන්න අඩි 06 පමණ දුර ප්‍රමාණයකින් සිට විමසූ බවත් මාස්ක් පැළඳ වෑන් රථය තුල සිටි පිරිස කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා ගාල්ල දෙසට පිටව ගිය බවත් එම සාක්ෂිකරුගේ ස්ථාවරය වී ඇත. පසුව එම නිලධාරියා ගාඩ් රූම් එක අස්කිරීමට එම ස්ථානයට පැමිණි අවස්ථාවේදී KDH සුදු පැහැති වෑන් රථය දෙවනවර පැමිණ ප්‍රධාන ගේට්ටුව අසල සිට වෙඩි තැබීමක් සිදු කල බවත් හෝටලයේ ගේට්ටුවේ සිදුරු අතරින් බැලීමේදී වෑන් රථයේ පැති දොර විවෘත කර තිබුණු බවත් එහි සිට වෙඩි තැබූ තැනැත්තා හඳුනාගැනීමට නොහැකිවූ බවත් ප්‍රකාශ කර ඇත. වැඩිදුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ "W15" හෝටලය දෙස සිට හෝ පිටතින් යම්

අයෙකු වෑන් රථයට වෙඩි තබන ආකාරය නිරීක්ෂණය නොකල බවයි. වෑන් රථයෙන් තබන ලද වෙඩි හෝටල් පරිශ්‍රය තුල බිත්තියේ සවි කර තිබූ "W15" ලොකු බෝඩ් එකට, බිත්තියට සහ ස්පා රූම් බෝඩ් එකට වැදී තිබෙන ආකාරය තමන් දුටු බවටද සාක්ෂි ලබාදී ඇත. වෑන් රථයේ පැමිණි නිලධාරීන් ප්‍රකාශ කර ඇති ආකාරයට වෑන් රථයේ සිට පිටතට වෙඩි තැබීම සිදුවූයේ පිටතින් වෑන් රථය දෙසට තබන ලද වෙඩි ප්‍රහාරයක් සඳහා ප්‍රතිප්‍රහාරයක් වශයෙන් නම් එවැනි මුල් වෙඩි තැබීමක් හාහිරින් සිදු වන ආකාරය සිදුවීම ඇසදුටු සාක්ෂිකරුවන් දැක තිබිය යුතුය. එමෙන්ම එවැනි වෙඩි තැබීමක් සිදුවූ බවට හිස් උණ්ඩ කොපු, වාහනය මත ගැටීම් සලකුණු නිරීක්ෂණය විය යුතු අතර, විද්‍යාත්මක සාක්ෂි අනුවත් සනාථ වීමක් සිදුවිය යුතුය. සිදුවීම ඇසදුටු "W15" හෝටලයේ ආරක්ෂක නිලධාරියා හෝ ජංගම රාත්‍රී සංචාරයේ යෙදී සිටි වෙඩි තැබීම සියැසින් නිරීක්ෂණය කල ජීප් රථයේ සිටි කිසිදු පොලිස් නිලධාරියෙකු හෝ වෑන් රථය දෙසට හාහිරින් යම් අයෙකු කරනු ලැබූ වෙඩි තැබීමක් නිරීක්ෂණය කර නොමැත. එමෙන්ම ස්ථානීය අපරාධ පරීක්ෂණ කටයුතු සිදුකල SOCO නිලධාරීන්ද සාක්ෂි දෙමින් සනාථ කර ඇත්තේ මුල් වෙඩිතැබීම කල වෑන් රථයේ ගමන්කල උ.පො.ප.මධුරංග නිලධාරියාගේ ගිණි අවියට අදාල T-56 වර්ගයේ හිස් උන්ඩ කොපු සහ ජීප්රථයේ සිට දෙවන වෙඩි තැබීම සිදුකල යුධහමුදා සැරයන් රුචිරංග නිලධාරියාගේ වෙඩි තැබීමට අදාල T-56 වර්ගයේ ගිනි අවියේ හිස් උන්ඩ කොපු හැර වෙනත් කිසිදු ගිණිඅවියකින් සිදුකල වෙඩිතැබීමකට අදාල හිස් උන්ඩ කොපු හෝ වෙනත් සාධක අපරාධ ස්ථානයේ තිබියදී සොයා නොගත් බවයි. රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්ථාව අනුවද

අපරාධ ස්ථානයේ තිබියදී සොයාගත් උන්ඩ උ.පො.ප.මධුරංග නිලධාරි භාවිතා කල ගිනිඅවියට සහ යුධ හමුදා සෙබල රුචිරංග නිලධාරියාගේ ගිනි අවියට පමණක් අදාල වන බවට සනාථ වේ.

එසේ හෙයින් එම සියළුම කරුණු අනුව අධිකරණය එළඹෙන නිගමනය වන්නේ ප්‍රශ්නගත සිදුවීම සිදුවූ අවස්ථාවේදී WPPK-7225 වැන් රථයට නාඳුනන තැනැත්තෙකු විසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලද බවටත් එයට ප්‍රතිප්‍රහාර ලබාදීමේදී වැන් රථයේ සිටි උ.පො.ප.මධුරංග නිලධාරියා විසින් T-56 ගිණිඅවියකින් කරන ලද වෙඩි තැබීම "W15" හෝටලයට එල්ල වූ බවටත් කරනු ලබන කියාපෑම සාවද්‍ය, විය නොහැකි සහ විමර්ශන නොමග යැවීමේ අරමුණින් ඉදිරිපත් කර ලද ස්ථාවරයක් බවයි. මෙම නඩුවේදී සලකා බලන ලද සියළුම සාධක මගින් අධිකරණය එළඹෙන නිගමනය වන්නේ WPPK-7225 දරණ පොලිස් දෙපාර්තමේන්තුව සතු වැන් රථයේ පැමිණි පිරිස විසින් එහි ගමන්කල උ.පො.ප.මධුරංග නිලධාරියා මගින් චේතනාන්විතව "W15" හෝටලය දෙසට රජයට අයත් T-56 වර්ගයේ ගිනිඅවියකින් වෙඩි ප්‍රහාරයක් ක්‍රියාත්මක කර ඇති බවත්, එම වෙඩිතැබීම නිරීක්ෂණය කරන ලද එම ස්ථානය පසුකර යාමට පැමිණි වැලිගම පොලිස්යේ ස්ථානාධිපති විසින් රාජකාරියේ යොදවා තිබූ රාත්‍රී ජංගම සංචාරයක ජීප් රථයේ ගමන් කල කණ්ඩායමේ නිලධාරී පො.සැ.සිසිර කුමාර නිලධාරියා විසින් අවිගත් අපරාධකරුවන් කණ්ඩායමක් විසින් ගිනිඅවියකින් සිදු කරනු ලබන වෙඩි තැබීම හේතුවෙන් ජීවිත සහ දේපල වලට සිදුවිය හැකි හානිය වලක්වා ගැනීමේ අරමුණින් කල වෙඩි තැබීමේ අණදීමක් යටතේ T-56 ගිනිඅවියක් මගින් යුධ හමුදා සැරයන්

03 MAR 2025

රුවිරංග නිලධාරියා වෙඩිතැබීමක් සිදු කර ඇති බවත්ය. සියළුම කරුණු අනුව අධිකරණය එළඹෙන නිගමනය වන්නේ මෙම නඩුවට අදාලව මියගිය මරණකරු වන පො.සැ.උපුල් නිලධාරියාගේ මරණයට හේතුපාදක වී ඇත්තේ දෙවන වෙඩි තැබීම සිදුකල යුධ හමුදා සැරයන් රුවිරංග නිලධාරියාගේ ගිනි අවියෙන් නිකුත් වුණු උණ්ඩ හේතුවෙන් ඇතිවූ තුවාල බවයි.

ඒ අනුව අධිකරණය විසින් තීරණය කල යුත්තේ මෙම නඩුවට විෂයගත සිදුවීමේදී මරණයට පත්වූ මානින්ගමුව ගෙදර උපුල් වාමින්ද කුමාර යන අයගේ මරණය සිදුකිරීම සම්බන්ධයෙන් ඉහත නිගමනය කරන ලද වෙඩිතැබීම සිදු කල යුධ හමුදා සැරයන් රුවිරංග නිලධාරියාට සහ/හෝ වෙඩි තැබීමට අණදීම සිදුකල පො.සැ. සිසිර කුමාර නිලධාරියාට සහ/හෝ අන් කවරකු හෝ තැනැත්තෙකුට සාපරාධී වගකීමක් පැවරිය හැක්කේද යන්නයි.

මේ සම්බන්ධයෙන් තීරණය කිරීමේදී අධිකරණය විසින් පිලිතුරු ලබා දිය යුතු නීතිමය ප්‍රශ්න කිහිපයක්ද පවතී. ඉන් පළමු ප්‍රශ්නය වන්නේ පොලිස් නිලධාරියෙකු හෝ නීතියේ බලය යටතේ කටයුතු කරන යම් නිලධාරියෙකු හෝ තැනැත්තෙකු කරනු ලබන යම් ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් උද්ගතව පවතින තත්වයන් සම්බන්ධයෙන් අපරාධමය වගකීමට යටත් කිරීමට අදාලව පවතින ශ්‍රී ලංකාවේ නීතිමය තත්වය කුමක්ද යන ප්‍රශ්නයයි. මෙම නඩුවට අදාලව යුධ හමුදා සැරයන් වරයෙකු ලෙස රාජකාරි කල චන්දිමාල් රුවිරංග යන නිලධාරියා විසින් තබන ලද වෙඩි පහර හේතුවෙන් මානින්ගමුව ගෙදර උපුල් වාමින්ද කුමාර නැමති පොලිස් නිලධාරියාගේ මරණයද, උ.පො.ප.මධුරංග යන නිලධාරියාට තුවාල සිදුවීමද, රජය වෙනුවෙන් පොලිස් දෙපාර්තමේන්තුව සතු

පොදු දේපලක් වශයෙන් පවතින WPPK-7225 දරන වෑන් රථයට අලාභ සිදුවීමද යන ප්‍රතිඵලයන් උද්ගතව ඇත. එම ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් වෙඩි තැබීම කල නිලධාරියාට සහ අණදීම කල නිලධාරියාට අපරාධමය වගකීමක් පැවරිය හැකිද යන්න තීරණය කලයුතුව පවතී. මෙම කරුණ සලකා බලා තීරණය කිරීමේදී සමගාමීව සලකා බැලිය යුතු නෛතික කරුණු දෙකක් පවතී. ඉන් එක් කරුණක් වනුයේ අපරාධ වගකීම තීරණය කිරීමේදී ඉහත සඳහන් ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් පොදු නීතිමය තත්වයක් අදාල වන්නේද නැතිනම් ප්‍රතිඵලයේ ස්වභාවය අනුව නීතිමය තත්වයේ වෙනස්කම් පවතින්නේද යන්නයි. දෙවන නෛතික කරුණ වන්නේ මෙම ප්‍රතිඵලය වූ ක්‍රියාවන් සිදුකර ඇත්තේ යුධ හමුදා නිලධාරියෙකු බැවින් ඔහුගේ ක්‍රියාව පොලිස් නිලධාරියෙකුට සමාන නෛතික තත්වයෙන් සලකා බැලිය යුත්තේද නොඑසේනම් එයට වෙනස්ව සලකා බැලිය යුත්තේද යන්නයි.

ශ්‍රී ලංකාවේ නීතිය තුල මෙම නෛතික කරුණු තීරණය කිරීමට සෘජුවම අදාල කරගත හැකි තනි නෛතික ප්‍රතිපාදනයක් නොපවතින බව සියළුම කරුණු සලකා බැලීමෙන් අනතුරුව අධිකරණය එළඹෙන නිගමනයයි. මෙම නෛතික ප්‍රතිඵලය පිලිබඳ නිගමනයට එළඹීමේදී සලකා බැලිය යුතු නෛතික ප්‍රතිපාදන ආකාර 04 කින් යුතු බව මාගේ නිගමනය වේ. මෙවැනි තත්වයක් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු 1978 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව, දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 65 වන අධිකාරය වන පොලිස් ආඥා පනත යන ශ්‍රී ලකාවේ ව්‍යවස්ථාදායකය විසින් සම්පාදිත පනත් එකී පළමු ආකාරයත්, පොලිස් ආඥා පනතේ බලය යටතේ සම්පාදිත දෙපාර්තමේන්තු

03 MAR 2025

නියෝග එහි දෙවන ආකාරයත්, කලින් කලට උපරිමාධිකරණය විසින් තඩු තීන්දු මගින් ප්‍රකාශිත නෛතික නිගමනයන් එහි තුන්වන අකාරයත්, සමාන තත්වයන් සම්බන්ධයෙන් අදාල කරගත හැකි සාධාරණත්වය සහ යුක්තිය පිලිබඳ සිද්ධාන්තයන් එහි හතරවන ආකාරයත් බව නිගමනය කරමි.

ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව පාර්ශවයක් යම් තැනැත්තෙකුට එරෙහිව කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිල්ලක් ඇතිකිරීම නොකලයුතු බවද 13 වන ව්‍යවස්තාව මගින් නීතියේ ස්ථාපිත ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් හැර කවරකු හෝ පුද්ගලයෙකුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හෝ දඩුවම් පැමිණවීම නොකලයුතු බවටද මූලික අයිතිවාසිකමක් වශයෙන් වන නෛතික ආකවරණයක් නිර්මාණය කර ඇත. එම නෛතික තත්වය අනුව නීතියෙන් නියම කර ඇති බලය සහ කාර්ය පටිපාටිය යටතේ හැර ඉන් පරිභාහිරව සිදු කරන ඕනෑම ක්‍රියාවකදී පොලිස් නිලධාරියෙකු තමා කල ක්‍රියාවේ ප්‍රතිඵලයට සාරානුකූල වන්නාවූ පුද්ගලික අපරාධමය වගකීමකට යටත් වන බව ඒ අනුව නිගමනය කරමි.

තමාට නීතියෙන් පැවරී ඇති බලය නීතියෙන් නියම කර ඇති නිශ්චිත ව්‍යතිරේඛී අවස්ථාවන්ට ඇතුලත් නොවන පරිදි අනීතික ලෙසට හෝ බලය ඉක්මවා භාවිතා කරනු ලබන පොලිස් නිලධාරියෙකු තමාගේ ක්‍රියාවෙන් උත්පාදනය වූ ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් අපරාධ වගකීමට පෞද්ගලිකව යටත් විය යුතු බවත්, එකී වගකීමෙන් මිදීමේ මුක්තියක් ශ්‍රී ලංකාවේ නීතියෙන් හිමිකර දී නොමැති බවත්, මූලික ලෙසට නිගමනය කරමි. පෞද්ගලිකව අපරාධ වගකීමට යටත්වීම පමණක් නොව

03 MAR 2025

එවැනි අනීතික හෝ බලය ඉක්මවා කටයුතු කරන නිලධාරියෙකු සිවිල් නීතියේ නෛතික වගකීම්වලටද, පොලිස් ආඥා පනත, දෙපාර්තමේන්තු නියෝග සහ ආයතන සංග්‍රහයෙන් පනවා ඇති ආයතනික විනය කඩ කිරීම් පිළිබඳ වගකීමටද යටත් වන බව මූලිකව නිගමනය කළ හැකි නෛතික තත්ත්වයකි. පොලිස් නිලධාරියෙකු ගිනි අවියක් අතදැරීමට නීතියෙන්ම අවසරලාභී පුද්ගලයෙකු ද එවැනි වෙඩි තැබීම් සඳහා පුහුණුවක් රජය විසින්ම සපයන ලද තැනැත්තෙකු වේ. එසේ හෙයින් ශ්‍රීලංකාවේ නීතිය අනුව පොලිස් නිලධාරියෙකුට තවත් තැනැත්තෙකුට වෙඩිතැබීමට අසීමාන්තික අයිතියක් සහ බලයක් තිබේ ද යන්න සලකා බැලිය යුතු නෛතික තත්ත්වයකි. තම රාජකාරී කටයුතු අතරතුර දී ශ්‍රී ලංකාව තුල රාජකාරියේ නිරතව සිටීමට පොලිස් නිලධාරියෙකුට සිය ගිනි අවියෙන් ඕනෑම අවස්ථාවක දී වෙඩිතැබීමක් සිදුකළ හැක්කේද යන කරුණත් එවැනි වෙඩි තැබීමක් මගින් උද්ගත වන ප්‍රතිඵලයන් සහ තැනැත්තෙකුගේ මරණය සහ තුවාල සිදුවීම පිළිබඳ ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් එම පොලිස් නිලධාරියාට අපරාධ වගකීමෙන් මිදී සිටීමේ මුක්තියක් තිබේ ද යන කරුණද මෙම කරුණට අදාළව එකවිට සලකා බැලිය යුතු නෛතික කරුණකි.

මෙසේ ඉහත සඳහන් කල පරිදි අපගේ මූලික නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවේ 13 වගන්තිය මගින් කිසිදු පුද්ගලයෙකුට එරෙහිව නීතියේ නිසි කාර්යපටිපාටිය (due Process) අනුගමනය කිරීමෙන් හැර දඩුවම ලබාදීමට හෝ මරණ දඩුවම ලබාදීමට නීතිමය අවසරයක් ලබා නොදෙයි. අපරාධ නඩු විධාන සංග්‍රහය, පොලිස් ආඥා පනත, දණ්ඩ නීති සංග්‍රහය හෝ අන් කවර නීතියක් හෝ මගින්ද පොලිස් දෙපාර්තමේන්තු නියෝග මගින්ද රාජකාරි ගිනි අවිය භාවිතා කර කරනු ලබන මනුෂ්‍ය ඝාතනයකදී හෝ අන් ආකාරයක ප්‍රතිඵලයක් වූ ක්‍රියාවක් ඇති කරන ලද අවස්ථාවක දී අපරාධ වගකීමෙන් මිදී සිටීමේ අයිතිවාසිකමකින් යුතු ඍජු ආකාරයේ මුක්තියක් පොලිස් නිලධාරීන්ට ලබාදීමක් සිදු නොකරයි. මෙම නෛතික

තත්ත්වයේ වෙනස් අදාලත්වය අවස්ථානුගත තත්ත්වයකදී ඉන්දියානු අපරාධ කාර්යපටිපාටිය නීතිය සමග සැසදීමෙන් හදුනාගත හැකිය. එම සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව අධිකරණය එළැඹෙන නිගමනය වන්නේ ශ්‍රීලංකාව තුල පොලිස් නිලධාරියෙකුට වෙනත් තැනැත්තෙකුට හෝ දේපලකට එරෙහිව සියගිනිඅවිය භාවිතා කිරීමට නිශ්චිත නීත්‍යානුකූල අවසරය හිමිවන අවස්ථාව වනුයේ පොලිස් දෙපාර්තමේන්තු නියෝගවල 19A යටතේ දක්වා ඇති වෙඩිතැබීම් නියෝග පිළිබඳ නිශ්චිත සහ සීමා සහිත අවස්ථාවන් යටතේ මෙන්ම සහ වෙඩිතැබීමට පූර්වයෙන් සහ පසුව අනුගමනය කළ යුතු නිශ්චිත කාර්යපටිපාටිය අනුගමනය කිරීම මත පමණක් බවයි. පොලිස් නිලධාරියෙකු විසින් සිය රාජකාරී ගිනි අවිය භාවිතා කරමින් අන් තැනැත්තෙකුට වෙඩි තැබීම ශ්‍රී ලංකාව තුල ඉතාමත් සීමාකාරී තත්වයන් යටතේ පමණක් අවසරලත් ක්‍රියාවක් බවත් එය ජනතාවගේ ජීවත්වීමේ අයිතිය, අභිමානවත්ව ජිවත්වීමේ අයිතිය සුරක්ෂණය කරන ආකාරයෙන් සහ අවි දරන නිලධාරීන්ගේ අත්තනෝමතික බලයෙන් මිදී සිටීමේ පුළුල් රැකවරණයක් හිමිකර දෙන නෛතික සුරක්ෂණයක් බවටද නිගමනය කරමි.

ඉහත සීමාකාරී තත්වයන් යටතේ වුවද සිය ගිනි අවිය භාවිතා කරන ලද පොලිස් නිලධාරියෙකු එනයින්ම තම වෙඩිතැබීමෙන් උද්ගතවූ නෛතික ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් අපරාධ වගකීමෙන් මුක්තියක් නොලබන අතර එය ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 69, 93, 96 දරණ ව්‍යතිරේඛ තත්වයන් යටතට ඇතුලත් වන තත්වයක් ද යන්න පිළිබඳව පරීක්ෂාවකටද යටත් බව අධිකරණයේ නිගමනයයි. ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 69 වන වගන්තිය මගින් ප්‍රතිපාදන දක්වා ඇත්තේ යම් ක්‍රියාවක් කිරීමට නීතියෙන් බැදී සිටින හෝ එසේ නීතියෙන් තමා බැදී ඇතැයි නීතිය පිළිබඳ වැරදීමකින් නොවන සිද්ධිය පිළිබඳ වැරදීමකින් සද්භාවයෙන් විශ්වාස කරන හෝ තැනැත්තෙකු විසින් කරන ලද කිසිවක් වරදක් නොවන බවයි. අපරාධ වරදින් මිදීමේ එකී ව්‍යතිරේඛ

03 MAR 2025

නෛතික ප්‍රතිපාදනය දැඩි සීමාකිරීමේ බලයට යටත් බව නීතිමය ප්‍රතිපාදනයන් අනුව සලකා බැලීමේදී නිගමනය කලහැකි නෛතික තත්වයයි. ශ්‍රී ලංකාව තුල පොලිස් නිලධාරියෙකු පොලිස් ආඥා පනතේ 56 වගන්තිය ප්‍රකාරව සාමය ආරක්ෂා කිරීමේ සහ සියළු අපරාධ, වරදවල් හා මහජන අනදරය වළක්වාලීමේ උපරිම වගකීමකින් බැඳී සිටින්නේ වුවද එම බලය නිල ගිනිඅවියකින් වෙඩිතබා පුද්ගලයෙකුගේ මරණය සිදුකිරීම දක්වා පුළුල් බලයක් නිර්මාණය නොකරයි. මෙම ව්‍යතිරේඛයේ අදාළත්වය සංශිප්තව ඇගයීමට ලක් කරන මහාචාර්ය G.L.පීරිස් මහතාගේ නිගමනය වන්නේ ක්‍රියාව නීත්‍යානුකූල අවස්ථාවකදී 69 වන වගන්තිය යටතේ සාපරාධී වගකීමෙන් මිදී සිටීමට ක්‍රියාව කල අයට හැකි නමුත් නීති විරෝධී නියෝග මත ඒවා පිළිපදිමින් හානි සිදුකරන තැනැත්තන්ට මෙම වගන්තියේ දක්වන /රැකවරනය හිමි නොවන බවත්ය. ( ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය, සාමාන්‍ය ව්‍යතිරේඛ G,L.පීරිස්, S. ගොඩගේ ප්‍රකාශන, පිටුව 189-190 )

මෙම නෛතික සංකල්පය පිළිබඳ එම නෛතික අදාලත්වය ප්‍රේමවති මනම්පේරි ඝාතන නඩු තීන්දුව පිළිබඳ අභ්‍යාවනයට අදාල 77 NLR 025 හි වාර්තා ගතව ඇති Wijesuriya Vs The State නඩුකරයේ දී පහත පරිදි නිගමනය කර ඇත.

> "Section 69 of the penal code which states that "nothing is an offence which is done by a person who is, or who by reason of a mistake of fact and not by reason of a mistake of law in good faith believes himself to be, biund by law to do it" can have no application when a person abbeys an order which is manifestly and obviously illegal"

ඒ අනුව වැඩිදුරටත් එම නඩු තීන්දුව මගින් තීරණය කර ඇත්තේ, ඉහළ නිලධාරියෙකු විසින් දෙන ලද අනීතික නියෝගයක් ක්‍රියාවට නගන ලද පහල නිලධාරියෙකුට සිය ක්‍රියාවේ ප්‍රතිඵලය වශයෙන් පවතින තත්වයට අදාළව අපරාධ වගකීමෙන් මිදීමේ සුරක්ෂණයක් ලෙස අපරාධ නඩු විධාන සංග්‍රහයේ 69 වන වගන්තියේ රැකවරණය හිමි නොවන බවයි.

යම් පොලිස් නිලධාරියෙකු විසින් කටයුතු කලයුතු නිශ්චිත ආකාරය සහ එවැනි නිලධාරියෙකු සතු නෛතික වගකීම පොලිස් ආඥා පනත මගින් දක්වා ඇති අතර, ඒ යටතේ සම්බන්ධිත දෙපාර්තමේන්තු නියෝග එම නෛතික යුතුකම් සහ වගකීම් විස්තරාත්මක ප්‍රතිපාදන මගින් පාලනය කරයි. ඒ අනුව එම නෛතික ලේඛන දෙකම නීතියේ බලය සහිත ප්‍රතිපාදනයක් ඇතුලත් ලේඛන වේ. පොලිස් ආඥා පනතේ 20 සහ 21 වගන්ති මගින් යම් පොලිස් නිලධාරියෙකු පවරනු ලබන යම් රාජකාරි ඉටුකිරීමට අනිවාර්ය ලෙස බැඳී සිටින බව දක්වා ඇති අතර, පනත මගින් සහ ලංකා දණ්ඩ නීති සංග්‍රහය මගින් එවැනි නියෝගයකට අවනත නොවීම දණ්ඩණීය අපරාධ වැරදි බවට පත් කර ඇත. ඉහත සඳහන් කරන ලද ප්‍රේමවති මනම්පේරි නඩු තීන්දුවේ නිගමනය අනුව යම් ඉහල නිලධාරියෙකු නිකුත් කරනු ලබන අනීතික නියෝගයක් ඉටු කිරීමට පහල නිලධාරීන් නීතිමය වශයෙන් බැඳී නොසිටින බවද, අනීතික නියෝගයක් වන කටයුතු කරනු ලබන යම් නිලධාරියෙකුට අපරාධ වගකීමෙන් මිදීමේ මුක්තියක් හිමි නොවන බවද විනිශ්චිත නෛතික තත්වයකි.

එසේ හෙයින් නෛතික තත්වය වන්නේ යම් නිලධාරියෙකුට තමන් සිදු කරන ලද ක්‍රියාවේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් අපරාධ වගකීමෙන් මිදී සිටීම සඳහා

එම ප්‍රතිඵලය නිර්මානය කල ක්‍රියාව නීත්‍යානුකූල ක්‍රියාවක් විය යුතු බවයි. ශ්‍රී ලංකාව තුල පොලිස් නිලධාරියෙකු හෝ යුධ හමුදා නිලධාරියෙකු කරනලද ක්‍රියාවක ප්‍රතිඵලය සම්බන්ධයෙන් අපරාධ වගකීමෙන් මුක්තිය හිමිවීම ප්‍රකාශිත ඍජු නෛතික අයිතියක් නොවන බවත්, එකී ක්‍රියාවේ නීත්‍යානුකූලභාවය පිලිබඳ පූළුල් පූර්ව සහ අධිකරණමය ඇගයීමකට ලක්කිරීමෙන් පසුව හිමිකරගත හැකි ද්විතියික අයිතිවාසිකමක් බවත් සියළු කරුණු සලකා බලමින් අධිකරණය එළඹෙන නිගමනය වේ.

එසේ වුවද අවධාරණය කරගත යුතු ඉතාමත් තීරණාත්මක කරුණක් වනුයේ පොලිස් නිලධාරියෙකු සතු කර ඇති මෙම මූලික බලය එකී පොලිස් ආඥා පනතේ බලය සමග නිර්මාණය කර ඇති දෙපාර්තමේන්තු නියෝග මගින් ඉතා දැඩි සීමාකිරීම් පද්ධතියකට යටත් කර බලතල ක්‍රියාත්මක කිරීමේදී පොලිස් නිලධාරියා සතු අභිමතානුසාරී බලය දැඩි ලෙස පාලනයකට නීතිය විසින්ම යටත් කර ඇති බවයි. පොලිස් ආඥා පනතේ 56 වගන්තිය මගින් පොලිස් නිලධාරියෙකු සතුකර ඇති බලය එවැනි දැඩි සීමාකිරීම් පද්ධතියක් මගින් පාලනය කිරීමේ අරමුණුවී ඇත්තේ පොලිස් නිලධාරීන් සහ සාමය ස්ථාපිත කිරීමේදී ක්‍රියාවට නංවනු ලබන පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාවන් හේතුවෙන් මහජනයාට හෝ ඔවුන්ගේ දේපල වලට අගතිදායී ප්‍රතිඵලයක් අතිවීම වැලැක්වීම සහ පොලිස් නිලධාරීන් අත්තනෝමතිකව බලය අයුතු ලෙස යොදවමින් මහජනතාව පීඩාවට පත්කර ආකාරයෙන් කටයුතු කිරීම වැලැක්වීම බව එම ප්‍රතිපාදන සලකා බැලීමේදී ඉතාමත් පැහැදිලිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ථ නීති තත්වය සලකා බැලීමේදී එළඹිය හැකි නිගමනය වන්නේ පොලිසිය

සතුකර ඇති නෛතික බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ සෙසු නීති මගින් ස්ථාපනය කර ඇති සියළු සීමාකිරීම් වලට යටත් වන බවයි. අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතියක දෘෂ්ටිකෝණයෙන් සලකා බැලීමේදී සමාජය තුල නීතියේ විධානය සහ ආධිපත්‍යයද සාමය ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ඇති පොලිස් නිලධාරීන්ද එම නෛතික වගකීම ඉටු කිරීමේදී නීතියෙන් පනවා ඇති සීමාවන් ඇතුලත අනිවාර්ය ලෙස කටයුතු කලයුතු බවත්, කවර තත්වයන් යටතේ වුවද නීතියෙන් අවසරදී ඇති සීමාවෙන් ඔබ්බට බලය ක්‍රියාත්මක කිරීමට පොලිසියට නීතියෙන් හැකියාවක් නොපවතින බවද නිගමනය කලහැකි තත්වයකි. වෙනත් වචන වලින් සලකා බලනු ලැබුවහොත් නීතියෙන් පනවා ඇති සීමාවෙන් ඔබ්බෙහි අත්තනෝමතිකව කටයුතු කරනු ලැබූ කවර මට්ටමේ හෝ පොලිස් නිලධාරියෙකුට තමන් කල ක්‍රියාව නීතියෙන් පනවා ඇති රාජකාරි වගකීමක් ඉටුකිරීමේදී සිදුවූවක් බවට ප්‍රකාශ කරමින් අපරාධ වගකීමෙන් මිදී සිටීමේ මුක්තියක් හිමි නොවන බවද වැඩිදුරටත් නිගමනය කරමි.

පොලිසියේ අත්තනෝමතික බලය යෙදවීමට එරෙහිව මහජනතාව සතු නෛතික රැකවරණය අපගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවෙන්ද සුරක්ෂිත, පොලිස් සේවය බිහිකිරීමේ මූලික අවදියේ සිටම පවතින නෛතික සංකල්පයක් බවද පැහැදිලිව හඳුනාගත හැකිය. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා අපරාධ විද්‍යාවේ මූලධර්ම 02 කෘතියේදී ( එස්.ගොඩගේ ප්‍රකාශන 1991 ) ශ්‍රී ලංකවේ පොලිස් සේවයද බිහිකිරීමේ මූලික අඩිතාලම නිර්මාණය කරන ලද මෙට්‍රෝපොලිටන් ඇක්ට් ( The metropolitan Act, 1829 ) පැවති පනත සහ

03 MAR 2025

බ්‍රිතාන්‍ය පොලිසියේ ක්‍රියාකාරීත්වය විමසමින් peter mannin, "police work Cambridge MMT-press, 1977" නැමති පර්යේෂණ ප්‍රකාශයන් උපුටා දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ පොලිසිය නැමති ව්‍යුහය සමාජයේ සාමය ආරක්ෂා කිරීම සහ අපරාධ වැලැක්වීමේ ක්‍රියාවලිය තුලදී මිල්ටරිමය ස්වභාවයෙන් ඉතා තදින් බලය නොයොදා හැකිතාක් දුරට සාමකාමී, හිංසාකාමී නොවන මැදිහත්වීම් මගින් ජනතාව අතර ගැටීම් හැකිතාක් අඩු කරමින් අපරාධ අඩු කිරීමේ ක්‍රියාවලියක් පැවැත්විය යුතු බවයි. ජනතාවට එරෙහිව හිංසාකාරී උපක්‍රම එම ක්‍රියාවලියට යොදාගත යුත්තේ අවසානම පියවර ලෙස බවයි. මෙම සංකල්පීය ප්‍රතිපත්තිය අවධාරණය කරමින් එංගලන්තයේ ස්වදේශ ලේකම් ලෙස ඉහත සඳහන් කලද මෙට්‍රෝපොලිටන් ඇක්ට් නැමති පනත සම්පාදනය කල රෝබට් පීල් සඳහන් කර ඇත්තේ පොලිස් සේවයේ ප්‍රධාන අරමුණ අපරාධ වැලැක්වීම බවත්, ඔවුන් අවි රැගෙන නොයා යුතු බවත්, තමන් ජනතාව අතරට යෑමෙන් අපරාධ නැවැත්වීමට මග සැලසිය යුතු බවත් අපරාධ වැලැක්වීමේ ප්‍රවේශය අපරාධ වලට දඬුවම් පැමිණවීමේ ප්‍රවේශයට වඩා යහපත් බවත්ය.

ඉහත සැලකිල්ලට ගනු ලබන සංකල්පීය නෛතික තත්වය ශ්‍රී ලංකාවේ පොලිස් සේවය තුලදීද නෛතිකව නිරූපනය වන බව පොලිස් ආඥා පනත සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නියෝග සලකා බැලීමේදී පැහැදිලි වන නෛතික තත්වයකි. එම නීතිමය ප්‍රතිපාදන මගින් සාමය ආරක්ෂා කිරීම සහ අපරාධ වැලැක්වීමේදී පොලීසිය ජනතාව මත යොදනු ලබන බලයේ නිශ්චිත සීමාවන් දක්වයි. අංක A19 දරන පොලිස් දෙපාර්තමේන්තු නියෝග වල 04 වන නියෝගය මගින් පොලිස් වෙඩි ප්‍රහාරවල අඩංගු යම් වරදක් කරහොත් හෝ

කරන්නට තැත් කරහොත් මිස කවර කරුණක් නිසාවත් වෙඩි නොතැබිය යුතු බවට පොලිස් නිලධාරීන්ට නියම කර ඇත. එහිදී වැඩිදුරටත් මෙසේ ප්‍රතිපාදන දක්වයි.

(4) කුඩා සන්නද්ධ පොලිස් කණ්ඩායමක් මහත් පිරිසක් සම්බන්ධයෙන් ක්‍රියා කරන විට බලවත් සැලකිල්ලෙන් ද සංයමයෙන් ද ක්‍රියා කළ යුතු ය. එම පිරිස පොලිස් වෙඩි අණවල අඩංගු යම් වරදක් කරතොත් හෝ කරන්නට තැත් කරතොත් මිස කවර කරුණක් නිසාවත් වෙඩි නොතැබිය යුතු ය.

තුවක්කු පාවිච්චි කිරීමෙ දී සියලුම පොලිස් නිලධාරීන් තමන් අයත් බලතල ගැන සම්පූර්ණ සැලකිල්ල දක්වන වගට විශ්වාසය තැබිය හැකි වන පරිදි මෙහි පහත සඳහන් නියෝගය කටපාඩම් කර ගෙන කියනමෙන් ඔවුන්ට නියම කරනු ලැබේ. මේ වූ කලි, දණ්ඩ නීති සංග්‍රහයේ 93 සහ 96 යන වගන්ති වලින් අර්ථ දක්වා ඇති පරිදි පුද්ගලයන් හා දේපල ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට ඇති බලතලවල සාරාංශයකි:-

"කලහකාරී පිරිසක් මෙහි පහත සඳහන් යම් අපරාධයක් - එනම් :-

(ඒ) මිනීමැරුමක් හෝ බරපතළ තුවාල;

(බී) කොල්ලකෑම;

(සී) දේපල සුරක්ෂිත ව තැබීම සඳහා පාවිච්චි කරන හෝ මිනිසුන් වාසය කරන ගෙවල් දොරවල්, වෙළඳ සැල්, බඩු ගබඩා හෝ පූජනීය ස්ථාන ගිනිතැබීම හෝ පුපුරන ද්‍රව්‍ය වලින්

03 MAR 20

ඒවාට හානි කිරීම (දණ්ඩ නීති සංග්‍රහයේ 96, 418 සහ 419 යන වගන්ති බලන්න);

(ඩී) ගෙවල් දොරවල්, වෙළඳ සැල්, බඩු ගබඩා හෝ පූජනීය ස්ථානවලට රාත්‍රියෙහි බලෙන් ඇතුල්වීම;

(ඊ) දවල් හෝ රෑ කවර අවස්ථාවක වුවද, ගෙවල් දොරවල්, වෙළඳ සැල්, බඩු ගබඩා හෝ පූජනීය ස්ථාන යන මේ යම් තැනක නිවැසි කෙනකුට මරණය හෝ බරපතල තුවාල හෝ සිදු වන අන්දමින් එම ස්ථානවලට පහර දීම - යන මේ යමක් කරනු හෝ කරන්නට තැත් කරනු මට දක්නට ලැබුණ හොත්, මට නියෝග ලබා ගැනීමට බලධාරී යම් කෙනකු එහි නැති අතර එම කලහකාරී පිරිස නැවැත්වීමට අන් නැත්නම් -

අනතුරට පත් තැනැත්තන් හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා එම කලහකාරී පිරිසට වෙඩි තැබීමට මට අයිතිය ඇත්තේ ය. වහාම ක්‍රියා කිරීම අවශ්‍ය ද, ආයුධ ගත් කණ්ඩායම පැමිණ සිටීම ම එම කලහ කාරී පිරිස වළකා ලීමට ප්‍රමාණවත් නොවේ ද යන වග, වෙඩි තබන ලෙස අණ දෙන්නට කලින් මා විසින් සලකා බැලිය යුතු ය.

සටහන - යම් අවස්ථාවක දී තුවක්කු පාවිච්චි කරන්නට සිදු වූ විට, වෙඩි තබා අවසන් වූ පසු නියම වශයෙන්ම වෙඩි තබන ලද වෙඩි උණ්ඩ ගණන එහි සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා ඉතා පරීක්ෂාවෙන් සටහන් කර තැබිය යුතු

ය. වෙඩි උණ්ඩ කීයක් වෙඩි තබන ලද ද යනු, කාරණයට ගැළපෙන පරිදි මුර වාර්තාවේ, තොරතුරු පොතේ හෝ නිලධාරීන්ගේ වාර්තාවේ සටහන් කර තැබිය යුතු ය"

ඒ අනුව කරුණු සලකා බැලීමේදී නිගමනය කලහැකි තත්වය වන්නේ ලංකා දන්ඩ නීති සංග්‍රහය යටතේ දක්වන 93 සහ 96 වගන්ති මගින් දක්වා ඇති ආත්මාරක්ෂාවේ අයිතිය නැමති අපරාධ වගකීම පිලිබඳ ව්‍යතිරේඛී ප්‍රතිපාදන වල රැකවරණය තුවක්කුවක් භාවිතා කරනු ලබන පොලිස් නිලධාරියෙකුට හිමිවනුයේ එම දක්වා ඇති අවස්ථානුගත තත්වය යටතේ කටයුතු කරනු ලබන නිලධාරියෙකු සම්බන්ධයෙන් පමණක් බවයි. මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා සිය Offences under the penal code of Ceylon කෘතියේදී (Lake house publication, 1973) පෞද්ගලික ආරක්ෂාවේ අයිතිය නැමති නීතිමය සිද්ධාන්තය ( Doctrine of private defence ) සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ලද පුද්ගලයෙකු විසින් කරන ලද ක්‍රියාවේ ප්‍රතිඵලයන්ට අදාලව අපරාධ වගකීම අදාල කිරීමේදී සලකා බැලිය යුතු ආකාරය සවිස්තරාත්මකව පැහැදිළි කරයි.

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තියේම 2 වන විශේෂ ව්‍යතිරේඛය පිලිබඳව යොමුවක් සහිතව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පිලිබඳ අදාලත්වය ප්‍රවේශ කිහිපයක් යටතේ සාකච්ඡා කර ඇත්තේ පහත ආකාරයටය.

**The position arising from this exception and from other relevant provisions of law may be stated as follows:**

03 MAR 2025

(i) **Where the accused acts in exercise of his fight of private defence, whether of person or of property, and restricts himself to the legitimate limits of that right, any harm caused to the aggressor, including infliction of death, does not involve the accused in criminal liability at all. The doctrine of private defence, in this type of case, procides a complete exculpatory plea.**

(ii) **Where the right of private defence could properly have been availed of, but the accused, in killing the deceased, exceeds that right in good faith without premeditation and without the intention of doing more harm than is required for the purpose of self-defence, the accused is neither convicted of murder nor released from liability altogether. The appropriate verdict in such a case is the lesser verdict of culpable homicide not amounting to murder.**

(iii) **If the accused exceeds the right of private defence not bona fide but with premeditation and with the deliberate intention of inflicting more harm than is necessary for the purpose of self-defence, liability for murder may be imposed if the victim's death is brought about.**

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය මගින් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය නැමති වරද අර්ථ දක්වා ඇති අතර, එහි 2 වන විශේෂ ව්‍යතිරේඛය මගින් ආත්මාරක්ෂාවේ අයිතිය වශයෙන් තැනැත්තකුගේ මරණය නීතියේ බලය

Adheesha Ariyathilaka

යෙදවීමකදී ප්‍රතිඵලය වන විට එය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය නැමති වරද සංස්ථාපනය නොකරන බව දක්වයි. මෙම නෛතික තත්වය සම්බන්ධයෙන් මෙහි ඉහත සලකා බලන ලදී. මෙහිදී තවදුරටත් සලකා බැලිය යුත්තේ ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 93 වන වගන්තිය සහ 96 වන වගන්තිය මගින් පනවා ඇති සාමාන්‍ය ව්‍යතිරේඛ වශයෙන් හඳුනවනු ලබන නෛතික අර්ථය තුලට ඇතුලත් ක්‍රියාව තුල පුද්ගලයා ප්‍රතිඵලයට අදාලව වන අපරාධ වගකීමෙන් මුක්තිය ලබන නෛතික ප්‍රතිපාදනයක් සම්බන්ධයෙනි. ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 93 වන වගන්තිය පහත ආකාරයෙන් ප්‍රතිපාදන දක්වයි.

> 93. ශරීරයේ පෞද්ගලික ආරක්ෂාව සඳහා වූ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට හේතු වූ වරද මෙහි පහත වෙන වෙනම දැක්වෙන වර්ග අතුරින් යම් වර්ගයකට අයත් වන වරදක් වේ නම්, ඉහතින් වූ වගන්තියේ සඳහන් සීමාකිරීම් යටතේ, ප්‍රහාරකයාගේ මරණය ස්වේච්ඡාවෙන්ම සිදු කිරීම හෝ ඔහුට වෙනත් පීඩාවක් සිදු කිරීම හෝ දක්වා ශරීරය පිලිබඳ පෞද්ගලික ආරක්ෂාව සඳහා වූ අයිතිවාසිකම ව්‍යාප්ත වේ. ඒ වර්ග කවරේද යත් -
>
> පළමුව- ප්‍රහාරකයාගේ මරණය හෝ ඔහුට වෙනත් පීඩාවක් හෝ සිදු නොකල හොත් යම් අඩන්තේට්ටමක ප්‍රතිඵලය මරණය සිදුවීම බවට සහේතුක බියක් ඇති කරන ආකාරයේ වූ අඩන්තේට්ටමක්;
>
> දෙවනුව - ප්‍රහාරකයාගේ මරණය හෝ ඔහුට වෙනත් පීඩාවක් හෝ සිදු නොකල හොත් යම් අඩන්තේට්ටමක ප්‍රතිඵලය බරපතල තුවාල සිදුවීම බවට සහේතුක බියක් ඇති කරන ආකාරයේ වූ අඩන්තේට්ටමක්;
>
> තුන්වනුව- ස්ත්‍රී දූෂණය කිරීමේ චේතනාවෙන් වූ අඩන්තේට්ටමක් ;
>
> හතරවනුව - අස්වාභාවික ලෙස කාමය සන්සිඳවා ගැනීමේ චේතනාවෙන් වූ අඩන්තේට්ටක්;
>
> පස්වනුව - අපහරණය කිරීමේ හෝ පැහැර ගෙන යැමේ හෝ චේතනායෙන් වූ අඩන්තේට්ටමක්;



Adheesha Ariyathilaka

03 MAR 2025

**භයවනුව - තමා නිදහස් කරවා ගැනීම සඳහා රජයේ බලධරයන් වෙත ඉදිරිපත් වීමට ඉඩ ඇති විය නොහැකි යැයි සහේතුකව තේරුම් ගැනීමට හැකි වන අවස්ථා යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තැබීමෙ චේතනාවෙන් වූ අඩන්තේට්ටමක්;**

ඒ අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 89 වන වගන්තිය සමග සලකා බැලීමේදී එහි 93 සහ 96 වගන්ති මගින් අර්ථ දක්වා ඇති පරිදි යම් අයෙකුගේ ශරීරයට අදාලව හෝ යම් දේපලකට අදාලව හෝ ආත්මාරක්ෂාවේ අයිතිය ( Right of private defence ) ක්‍රියාවට නගමින් සිදු කරන ක්‍රියාවක ප්‍රතිඵලයක් සම්බන්ධයෙන් කිසිදු අපරාධ වගකීමක් ක්‍රියාව සිදුකල තැනැත්තාට අදාලව උත්පාදනය නොවන බව නිගමනය කරමි.

මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර නැමති පුද්ගලයාගේ මරණය, උ.පො.ප.මධුරංග නැමති නිලධාරියාට තුවාල සිදුවීම, පොදු දේපලක් වන WPPK-7225 දරන වෑන් රථයට අලාභ සිදුවීම නැමති ප්‍රතිඵලයන් උද්ගතවී ඇත්තේ වැලිගම පොලිසිය විසින් සිදුකල රාත්‍රී ජංගම මුර සංචාරයේදී පොලිස් සැරයන් 16089 ඉමදුව මානගේ අජිත් සිසිර කුමාර යන පොලිස් නිලධාරියා විසින් කරනු ලැබූ අණදීම මත එම රාජකාරියට අනුයුක්තව සිටි යුධ හමුදා සැරයන් 02725 චන්දිමාල් රුචිරංග නිලධාරියා විසින් T-56 වර්ගයේ ස්වයංක්‍රීය වර්ගයේ ගිනි අවියකින් තබන ලද වෙඩි ප්‍රහාර හේතුවෙන් බව සියළුම සාක්ෂි, වාර්තා සහ කරුණු සලකා බලමින් මෙහි ඉහත නිගමනය කරන ලදී. අදාල ක්‍රියාව තුල නිලධාරීන් අධිකරණයට නඩුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ එදින රාජකාරියේ නිරතව රාත්‍රී ජංගම මුර සංචාරයේ සිටියදී පැලැන මංසන්දිය අසල "W15" හෝටලය ඉදිරිපිට සුදු පැහැති වෑන් රථයකින් පැමිණි පිරිසක් ගිනි



Adheesha Ariyathilaka

අවියකින් එම හෝටලය දෙසට වෙඩි තබනු දුටු බවත්, එම ක්‍රියාව කල පුද්ගලයින් යම් අපරාධකරුවන් පිරිසක් ලෙසට ඇතිකරගත් නිගමනය මත පදනම්ව තමන්ගේ සහ අන් අයගේ ජීවිතද, දේපලද ආරක්ෂා කර ගැනීම සඳහා වෙඩි තැබීමේ ක්‍රියාව සිදුකල බවයි. ඒ අනුව අධිකරණය විසින් නිගමනය කල යුත්තේ එකී පොලිස් නිලධාරී අජිත් සිසිර කුමාර සහ යුධ හමුදා සැරයන් චන්දිමාල් රුවිරංග කල ක්‍රියාවේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඉහත සලකා බලන ලද ආත්මාරක්ෂාවේ අයිතිය පිලිබඳ සිද්ධාන්තය යටතේ අපරාධ වගකීමෙන් මුක්තියක් හිමිවන්නේද යන්නයි.

එම කරුණ තීරණය කිරීමේදී අධිකරණය අදාල කරගතයුතු මූලික පරීක්ෂාව වන්නේ පුද්ගලික ආරක්ෂාවේ අයිතියට අදාලව පොලිස් නිලධාරියෙකු සම්බන්ධයෙන් නීතියෙන් නියමකර ඇති සීමාවන් තුල එම ආත්මාරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කර ඇත්තේද යන්නයි.

මෙම නඩුවට අදාලව ඉදිරිපත්ව ඇති සාක්ෂි, වාර්තා, විමර්ශන ප්‍රගතිය අනුව 2023.12.31 දිනය වන විට එකී අජිත් සිසිර කුමාර නිලධාරියා සහ එම රථයේ යොදවා සිටි යුධ හමුදා නිලධාරියා කටයුතු කර ඇත්තේ නීත්‍යානුකූල නියෝග ප්‍රකාරවය. එම නීත්‍යානුකූල නියෝග අනුව රාත්‍රී ජංගම මුර සංචාරයේදී ඔවුන් ගිනි අවි යොදාගෙන "W15" හෝටල් පරිශ්‍රය දෙසට වෙඩි තබන වෑන් රථයක පැමිණි පිරිසක් නිරීක්ෂණය කර ඇති අතර එම ක්‍රියාව වැලැක්වී අරමුණු කර T.56 ගිනි අවියක් මගින් පලායන වෑන් රථයට වෙඩි තැබීමක් සිදුකර ඇත. එම වෑන් රථය විසින් "W15" හෝටලය දෙසට වෙඩි තබන ආකාරය නිරීක්ෂණය කිරීමෙන් පසුව ජීප් රථය නවතා සිසිර කුමාර

නිලධාරියා රථයෙන් බිමට බැස ඇති අතර, වෑන් රථය එම දෙසට ගමන් කර ඇත. එම අවස්ථාවේදී වෙඩි තැබීමට අණදීම සම්බන්ධයෙන් නිගමනයට එළඹීමට හේතුවූ අවස්ථානුගත තත්වය සාක්ෂිකරු පහත පරිදි පැහැදිලි කර ඇත.

"මුහුදුබඩ මාර්ගයේ ගාල්ල දෙසට යනවිට වටරවුම පසුකරවාත් සමගම "W15" හෝටලයේ ඉදිරිපිට සුදුපැහැති වෑන් රථයක් නවතා තිබුනා. "W15" හෝටලය දෙසින් වෑන් රථය පේනතෙක් මානයේදී රතිඤ්ඤා පුපුරන හඩට සමාන හඩක් ඇසෙන්න පටන් ගත්තා. වෑන් රථය දෙසින් ගිණි පුපුරු වැනි එලි මාහට නිරික්ෂණය වුනා. වෑන් රථය ගාල්ල දෙසට මුහුණලා තිබුනේ. වෑන් රථයට වම් පසින් ගිනි පුපුරු පිට වුනා. ශබ්දය ඇසුනේ "W15" හෝටලය දෙසින්. හෝටලය ඇතුලත ප්‍රදේශය මාර්ගයට පේන්නේ නැහැ. ඒ වෙලාවේදී "W15" හෝටලයේ විදුලි පහන් දැල්වුනා. එහි සාමාන්‍ය ආලෝක තත්වයක් තිබුනා. එම සිද්ධිය දැක්කම එම ශබ්දය නිසා අපි හිතුවේ අලුත් අවුරුදු උදාව නිසා රතිඤ්ඤා පත්තු කරන ශබ්දය කියලා. එසේ අප ගමන් කල ජීප් රථය, වෑන් රථය පසුකර ඉදිරියට ගමන් කලා. වෑන් රථයට දකුණු පසිනක් ජීප් රථය ගමන් කලේ. වෑන් රථය පසු කරනවාත් සමගම මාහට දක්නට ලැබුනා වෑන් රථයේ වම් පැති දොර ඇර තිබෙන බවත්, එම පැති දොර අසල තිබූ සීට් එකේ කලු පැහැති ඇඳුමක් ඇඳගත් කෙනෙක් "W15" හෝටලයේ ගේට්ටුව දෙසට තුවක්කුවකින් වෙඩි තබන හැඩරුව දුටුවා. අපි එතනින් ඉදිරියට ගමන් කලා. වෑන් රථය පසු වුනා. වෙඩි තබන පුද්ගලයකුගේ එල්ලයක් මම දැක්කේ නැහැ. "W15" හෝටලයේ ගේට්ටුව දෙසට වෙඩි තියනවා දැක්කේ. වැලිගම පොලිසියේ වසර 05 ක පමණ මගේ සේවා කාලයක් තියෙනවා. මට තවම එම හෝටලය ගැන එතරම් දැනුවත් බවක් නැහැ. එම හෝටලයට ඇතුල්වීමට හා පිටවීමට ගේට්ටු තියෙනවා. ඇතුල්වීමට තියෙන ගේට්ටුවෙන් වම් පසට තමයි වෙඩි තියනවා දුටුවේ. ඊට පස්සේ මා මගේ රියදුරු වශයෙන් කටයුතු කල පො.සැ.7809 විතානගේ නිලධාරියාට දැනුම් දුන්නා ජීප් රථය ඉදිරියෙන් නවත්වන්න කියලා. ජීප් රථය නැවැතුතුවා. නවත්වපු තැන සිට මීටර් 10 ක් පමන වෑන් රථයෙය් සිට ජීප් රථයට දුර තිබුනා. වෑන් රථයේ ඉදිරිපස සිට ජීප් රථයේ පිටුපස දක්වා දුර මීටර් 10 ක් පමණ තිබුනා. පසුව මා රියදුරුට දැනුම් දුන්නා ජීප් රථය නවත්තන්න කියලා. ජීප් රථය, වෑන් රථය පසුකර මදක් ඉදිරියේ පාර අයිනේ වෑන් රථයට පෙනෙන ලෙස ජීප් රථය නැවැත්තතුවා. ඉන් අනතුරුව මම ජීප් රථයෙන් බැස්සා. අනෙකුත් නිලධාරීන් ජීප් රථයේ රැදී සිටියා. මා ජීප්

03 MAR 2025

රථයෙන් බැස මාගේ ජීවිත අවධානය නොතකා මෙම ස්ථානයට වෙඩි තබන්නේ කවුරුන්ද කියා විමර්ශනය කිරීමට ගියා. නමුත් මා ජීප් රථයෙන් බහිනවාත් සමගම "W15" හෝටලය දෙසට වෙඩි තබමින් සිටි වෑන් රථයේ සිටි අය එක් වරම අපි නවතා සිටි ජීප් රථය දෙසට පැමිණියා. එවිට මාහට මෙම වෑන් රථය නවත්වා ගැනීමට ක්‍රම වේදයක් නොමැති බැවින් ඔවුන් පැමිණ මාගේ ජීවිතයට, ජීප් රථයේ සිටි අනෙකුත් නිලධාරීන්ගේ ජීවිත වලට තර්ජනයක් වේ යැයි සිතා වෑන් රථය දෙසට වෙඩි තබන ලෙමෙම දැනුම්දීමක් කලා"

එම අවස්ථානුගත තත්වය ගිනි අවියෙන් වෙඩි තැබීම කල යුධහමුදා සැරයන් රුවිරංග යන අයද සිය සාක්ෂියේදී පැහැදිලි කර ඇත.

"ජීප් එක නතර කරලා සිසිර නිලධාරියා බිමට බැස්සා, වෙන කවුරුවත් ජීප් රථයෙන් බැස්සේ නෑ. අපිට බහින්න වෙලාවක් තිබුනේ නැහැ. සිසිර මහත්තයා ඉස්සරහ දොර ඇරගෙන ක්ෂණිකව බැස්සා. ඒ බහින කොට වෑන් එකේ අය කලබල වෙලා පලා යන්න හැදුවා. ඒ වෙලාවේ වෑන් එකෙන් බිමට බැහැලා කවුරුවත් හිටියේ නැහැ. වාහනය නවත්වන්න රෝද වලට වෙඩි තියන්න කියලා සිසිර නිලධාරියා කිවුවා. මම හිටියේ ජීප් එකේ දකුණු පැත්තේ. වෑන් එක ඉස්සර කරේ ජීප් එකට දකුණු පැත්තෙන්. වෑන් රථයට වෙඩි තිබ්බෙ රුවිරංග වන මම විසින්. වෑන් රථයේ ජනෙල් ඇරලා තිබුනේ. සාමාන්‍ය යෙන් කවුලුව පළල අඩි 1 ½ ක් විතර උස අඩි 1 ½ ක් 2 ක් විතර කවුලුවක්. ගිනි අවියක් මගේ අත තිබුනේ නැහැ. ප්‍රභාත්ගේ අතේ තිබුණු ගිනි අවියෙන් තමයි මම වෙඩි තිබ්බෙ. ටයරය ප්‍රදේශයට තමයි කුරුමානම අල්ලලා වෙඩි තිබ්බෙ"

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිමය ස්ථාවරය අපරාධය පිලිබඳව සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී අනාවරණය කරගත් සාක්ෂි මගින්ද තහවුරු වී ඇති බව මාගේ නිගමනයයි. WPPK-7225 වෑන් රථයේ සිට උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා විසින් T.56 වර්ගයේ ගිනි අවියකින් ( පැ.30) "W15" හෝටලය ඉලක්ක කර වෙඩි ප්‍රහාර 14 කට වැඩි සංඛ්‍යාවක් එල්ල කර ඇති බව විමර්ශනයේදී සනාථකර ගෙන ඇති තත්වයකි. එම වෙඩි ප්‍රහාර "W15" හෝටලයේ ඉදිරිපස තාප්පයේ, පහල මාලයේ ස්ථාන කිහිපයක, සහ ඉහල

මහලේ ස්ථාන කිහිපයකට වැදී ඇති ආකාරයත් එමගින් සිදුවූ හානි පිළිබඳවත් මහේස්ත්‍රාත් පරීක්ෂණයේදී සහ විමර්ශනයේදී නිරීක්ෂණය කර හඳුනා ගෙන ඇත. එම කරුණු අනුව නිගමනය කල හැක්කේ ගිනි අවියක් භාවිතා කර "W15" හෝටලය දෙසට වෑන් රථයේ සිට කරන ලද වෙඩිතැබීමේ ක්‍රියාව වැලැක්වීමේ අරමුණින් සහ පුද්ගලයින්ගේ ජීවිත හානි වැලැක්වීමට ආත්මාරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කිරීමට නීත්‍යානුකූල වෙඩි තැබීමේ බලය යෙදවීමේදී මෙම ප්‍රතිඵලයන් උද්ගතව ඇති බවයි. එසේ හෙයින් වෙඩි තැබීම සිදුකල යුධ හමුදා සැරයන් චන්දිමාල් රුවිරංග නිලධාරියා සහ එයට අණදුන් පො.සැ.අජිත් සිසිර කුමාර නිලධාරියා යන දෙදෙනාම ඔවුන් කල ක්‍රියාව නීතියෙන් නියම කර ඇති බලයේ සීමාවට ඇතුලත්ව ආත්මාරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ සත්භාවී අරමුණින් වරදක් කිරීමේ කිසිදු සාවද්‍ය මනසක් නොමැතිව සිදුකල ක්‍රියාවක ප්‍රතිඵලය වශයෙන් පවතින බවත්, කිසිඳු වරදක් සම්බන්ධයෙන් අපරාධමය වගකීමට එම නිලධාරීන් දෙදෙනා යටත්කල නොහැකි බව නිගමනය කරමි. එම සිදුවීමේදී ප්‍රතිඵලය වශයෙන් පවතින මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර යන තැනැත්තාගේ මරණය, උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියාට තුවාල සිදුකිරීම, පොදු දේපලක් වන WPPK-7225 වෑන් රථයට අනර්ථය සිදුකිරීම යන වැරදි සම්බන්ධයෙන් ඉහත නම් සඳහන් කල වෙඩි තැබීමේ ක්‍රියාව සිදුකල යුධ හමුදා සැරයන් චන්දිමාල් රුවිරංග නිලධාරියාට සහ එම වෙඩි තැබීමට අණදුන් පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර නිලධාරියාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට

03 MAR 2025

ප්‍රමාණවත් හේතු නොපවතින බවට සියළුම කරුණු සමස්ථයක් ලෙස සලකා තීරණය කරමි.

ඉහත එළඹෙන ලද නිගමනය මත අධිකරණය තවදුටත් තීරණය කල යුත්තේ මෙම ප්‍රශ්නගත සිදුවීමේදී WPPK-7225 වැන් රථයෙන් පැමිණ "W15" හෝටලයට වෙඩි තැබීම සිදුකල උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා, එම පැමිණි සෙසු නිලධාරීන් සියල්ලම, කිහිප දෙනෙකු හෝ එක් අයෙකු හෝ එම ක්‍රියාවට අදාලව සබඳතා දක්වන වෙනත් යම් තැනැත්තෙකුට විරුද්ධව අපරාධ නඩු කටයුත්ත තවදුරටත් පවත්වාගෙන යාමට තරම් එම සිදුවීමේ ප්‍රතිඵලයන් හා සබැඳිව අපරාධ වගකීමට යටත් කිරීමට තරම් ප්‍රමාණවත් හේතු පවතින්නේද යන්නයි. මෙම නඩුවට අදාලව මුල් විමර්ශනය කරන ලද වැලිගම පොලීසිය විසින් මුල් විමර්ශන වාර්තා මගින් ඉදිරිපත් කල ස්ථාවරයට වඩා වෙනස්ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය මත පදනම්ව කරුණු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. 2024.10.22 දිනැතිව මෙම නඩුවේ ඉදිරි විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගෙන ඇත. එම තොරතුරු වාර්තා මගින් සහ වාචික කරුණු දැක්වීම් මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දන්වා ඇත්තේ මෙම ප්‍රශ්නගත සිදුවීමේදී WPPK-7225 දරන රථයේ ගමන් කරමින් මාතර, පැලැන "W15" හෝටලයට වෙඩි තැබීමේ ක්‍රියාව එවකට වැඩ බලන පොලිස්පති ධූරයේ රාජකාරි කල බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නැමැත්තාගේ නීත්‍යානුකූල නොවන නියමයක් මත රජයේ වාහන, නිලධාරීන් සහ ගිනිඅවි භාවිතා කරමින් සිදුකල ක්‍රියාවක්ද යන්න සම්බන්ධයෙන්

විමර්ශනයක් දියත්කර ඇති බවයි. වැඩිදුරටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර ඇත්තේ එම ක්‍රියාවට අදාලව එවකට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යධූරය දන ලද ටිරාන් අලස් නැමති තැනැත්තා මෙම සිදුවීමට සබැඳිව යම් වරදක් සිදුකර තිබේද යන්න සම්බන්ධයෙන්ද පරීක්ෂණයක් සිදු කරන ලද බවයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සිය විමර්ශනයට අදාලව පහත කරුණු සාක්ෂි සහ ස්ථාවරයන් අධිකරණයට ඉදිරිපත් කර ඇත.

(1) කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් වැලිගම පැලැන "W15" හෝටලය පිහිටි ප්‍රදේශයට පැමිනීමට අදාලව පොලිස්පතිවරයාගේ නීත්‍යානුකුල නියෝග ලබා ගත් බවට සඳහන් ලිපි ලේඛන නීත්‍යානුගූලව සහ විධිමත්ව බස්නාහිර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට යොමුකර නැති බව සහ එවනු ලබන ලේඛන අංක වශයෙන් වෙනත් ලිපි සඳහා ලියාපදිංචි කර ඇති අංක දෝශ සහගතව සඳහන් කර ඇති බව,

(2) සිද්ධියට අදාලව නීතිපතිතුමා විසින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව 2025.02.08 වන දිනැතිව කොළඹ අපරාධ කොට්ඨාශය අනුයුක්තව සිටි මෙම සිද්ධියට සම්බන්ධ වූ නිලධාරීන් වන

I. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලම්ද සිල්වා.

II. පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දූනුසිංහ.

III. උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග.

IV. පො.සැ.69480 ප්‍රසන්ත කුමාර.

03 MAR 2025

V. පො.කො.2204 සුපුන් ප්‍රියශාන්.

VI. පො.කො.පී.89728 දුලිප් ගිහාන් පියතිස්ස

යන අයගේ ප්‍රකාශ සටහන් කරගනු ලැබූ බවත්, එම ප්‍රකාශ මගින් අනාවරණය වූ කරුණු සහ සිද්ධිය පිලිබඳ විමර්ශනය මගින් අනාවරණය වූ කරුණු අතර පරස්පරතාවයක් පවතින බවත් තුන්වන පාර්ශවයක් විසින් වෙඩි තැබීමෙ සිද්ධිය ව්‍යාජ ලෙස ගොතන ලද සිද්ධියක් බවත් එවැනි තෙවන පාර්ශවයකින් සිදුකල වෙඩි තැබීමක් සම්බන්ධයෙන් කිසිදු කරුණක් විමර්ශනයේදී අනාවරණය වී නොමැති බව,

(3) ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගවන SCFR/288/2021දරන නඩුවටද පාදක වූ කොළඹ, ඩාර්ලිපාරේ ශාන්ත ජෝශප් විද්‍යාලය ඉදිරිපිට ඉඩමක් සම්බන්ධයෙන් ආරවුලට අදාලව සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් මාසිකව රුපියල් ලක්ෂ 01 ½ ක මුදලක් උපදේශක සේවා සඳහා දේශබන්දු තෙන්නකෝන් යන අයට ගෙවා ඇති බවට වන ප්‍රචාරයක් මාධ්‍ය මගින් ප්‍රචාරය කලේයයි ඔහු සම්බන්ධයෙන් වරදවා තේරුම් ගැනීම මගින් ආරවුල් තත්වයක් "W15" හෝටලයේ හිමිකරු වන මොහොමඩ් නිෂාම් ජමාල්ඩීන් යන අය සහ මෙම ප්‍රශ්නගත පොලිස් නිලධාරීන් පිරිසට නියෝග ලබාදුන් දේශබන්දු තෙන්නකොන් යන අය අතර පැවති බව ,

(4) ප්‍රශනගත සිදුවීම "W15" හෝටලය ඉදිරිපිටදි සිදුවී වෑන් රථයේ සිටි නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි ප්‍රහාර මගින් තුවාල සිදුවී තිබියදී පොලිස් නිලධාරීන්ට ඒ බව හෙළිදරවු කිරීමට වෑන් රථයේ සිටි

නිලධාරීන් කටයුතු කර නොමැති බව සහ සිදුවීමෙන් පසුව තුවාල ලබා නිලධාරීන් රෝහලකට ඇතුළත් කර ප්‍රතිකාර ලබාදීමට උත්සාහ නොකර එම තුවාලකරුවන්ද රැගෙන කොළඹ ප්‍රදේශයට ගමන් කිරීමට බලපෑම් සහගතව උත්සාහයක් දරා ඇති බව.

(5) අපරාධ ස්ථානයේ වැටී තිබියදී සොයාගත් උණ්ඩ කොපු සියල්ලම කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් විසින් භාවිතා කරන ලද අංක 1515969 දරන (පැ.30) ටී-56 ගිනි අවියෙන් වෙඩි තැබීමේදී නිකුත්වූ උණ්ඩ කොපු බවට රස පරීක්ෂක වාර්තාව අනුව සනාථ වන බව,

විමර්ශනයෙන් අනාවරණය කරගත් එම කරුණු බොහොමයක් මරණ පරීක්ෂණයට අදාලව ඉදිරිපත්ව ඇති වෙනත් ස්වාධීන සාක්ෂි මගින්ද සනාථ වී ඇති බව නිගමනය කරමි.

මෙහිදී සලකා බැලිය යුතු මූලික කරුණක් වන්නේ කොළඹ අපරාධ කොටඨාශයේ නිලධාරීන් විසින් "W15" හෝටලය අසලදී එම හෝටලය වෙතට සිදුකල වෙඩිතැබීමේ ක්‍රියාව පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් කල නීත්‍යානුකූල ක්‍රියාවක්ද නොඑසේනම් නීත්‍යානුකූල ක්‍රියාවක් නොවන අපරාධමය වගකීමක් උත්පාදනය කරන ක්‍රියාවක්ද යන්නයි. සිදුවීමට අදාලව කොලඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් සාක්ෂි දෙමින් සහ ප්‍රකාශ ලබා දෙමින් සඳහන් කර ඇත්තේ 2023.12.30 දිනට වන විට වැඩබලන පොලිස්පති ධූරයේ රාජකාරි ආවරණය කල බස්නාහිර පළාත භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් යන අයගේ ඍජු නියමය සහ නියෝග

මත වෙනත් කිසිදු පොලිස් නිලධාරියෙකුට නොදන්වා හරක්කටා නැමති පාතාල නායකයාගේ මත්ද්‍රව්‍ය සහ වෙනත් අපරාධ සම්බන්ධයෙන් කටුයුතු කරන අපරාධකරුවන් පිරිසක් අත්අඩංගුවට ගැනීම සඳහා මාතර, වැලිගම ප්‍රදේශය තුල මෙහෙයුමක් ක්‍රියාත්මක කල බවත් ඒ මෙහෙයුම අතරතුරදී වැලිගම, පැලැන ප්‍රදේශයේ පිහිටි "W15" හෝටලය ඉදිරිපිටදී එහි රැඳී සිටි සැකසහිත පුද්ගලයෙකු පරීක්ෂා කිරීමට යාමේදී එම පුද්ගලයා වෑන් රථය දෙසට වෙඩි තැබීමක් සිදුකල බවත්, එයට ප්‍රතිප්‍රහාර වශයෙන් ආත්මාරක්ෂාව සලසා ගැනීමට වෑන් රථයට තුල සිටි උ.පො.ප.මධුරංග නිලධාරියා විසින් වෑන් රථය තුල සිටම වෙඩි තැබීමක් සිදුකල බවත්ය. එම වෙඩි හුවමාරුවේදී වෑන් රථය තුල සිටි නිලධාරීන් දෙදෙනෙකු තුවාල ලැබූ බවත් කිසිදු අවස්ථාවක එහි තිබූ පොලිස් ජීප් රථයක් නිරීක්ෂණය නොකල බවත්, ගුගල් සිතියම භාවිතා කරමින් තුවාලකරුවන් ගාල්ල කරාපිටිය රෝහලට ප්‍රවාහනය කිරීමට කටයුතු කරමින් සිටියදී ඉමදුව අන්තර් හුවමාරුවේ රාජකාරි කල පොලිස් නිලධාරීන් පිරිස ගමන්කල වෑන් රථයට අධිවේගී මාර්ගයට පිවිසීමට අවසර ලබා නොදී එහි රඳවාගත් බවත්, 1990 සුවසැරිය ගිලන්රථය මගින් තුවාලකරුවන් ගාල්ල කරපිටිය රෝහලට යොමුකල බවත්ය. පසුව තුවාල ලබා සිටි උපුල් කුමාර නැමති පොලිස් නිලධාරියා එම සිදුවීමේදී ලය තුවාල හේතුවෙන් මරණයට පත්වූ බව දැනගැනීමට ලැබුණු බවද එම ස්ථාවරය මගින් සඳහන් කර ඇත.

මෙම නඩුවේ පැමිණිල්ල මෙහෙයවන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ දක්වා සිදු කරන ලද විමර්ශන පාදක කරගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති ස්ථාවරය වන්නේ කොළඹ අපරාධ කොට්ඨාශය

උ.පො.ප.මධුරංග නිලධාරියා ඔහු භාවිතා කල අංක 1515969 දරන ටී-56 වර්ගයේ ගිනි අවියෙන් ( පැ.30 ) කල වෙඩි තැබීමක් පොලිස් ජංගම රාත්‍රී මුර සංචාරයේ යෙදී සිටි යුධහමුදා සැරයන් රුවිරංග නිලධාරියා භාවිතා කල අංක 5380171 දරන ගිනි අවියෙන් ( පැ.2 ) කල වෙඩිතැබීමක් හැර වෙනත් තුන්වන පාර්ශවයක් විසින් සිදුකල වෙඩි තැබීමක් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් අනාවරණය නොවන බවත් එම තත්වය රස පරීක්ෂකවරයාගේ විශ්ලේශන වාර්තාව මගින්ද මනාව සනාථ වන බවත්ය. සිදුවීමට අදාලව කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් විසින් අධිකරණය හමුවේ ගනු ලබන ස්ථාවරය සත්‍යයෙන් තොර, නිර්මාණය කර අසත්‍ය ලෙස ගොතන ලද්දක් බවට සියළුම සාක්ෂි සලකා බැලීමේදී නිගමනය කල හැකි කරුණකි. "W15" හෝටලය ඉදිරිපිටදී සැකකටයුතු පුද්ගලයෙකු සමග වෙඩි හුවමාරුවක් ඇතිකරගත් බවට වන ස්ථාවරය අසත්‍ය බව විමර්ශකයින් තහවුරු කරගෙන ඇත. වෙඩි තැබීමේ සිදුවීම සිදුවීමට ආසන්න කාලසීමාවකදී මෙම වෑන් රථයේ ගමන්කල නිලධාරීන් පිරිස එහි පැමිණ පිටවයාමක් සිදුකල බවටද සාක්ෂි ඉදිරිපත් වී ඇත. විමර්ශන නිලධාරීන්, SOCO නිලධාරීන්ගේ ස්ථානීය විමර්ශනයද පදනම් කරගනිමින් අධිකරණයට වාර්තා කර ඇත්තේ "W15" හෝටලය ඉදිරිපිටදී වෙනත් භාහිර පර්ශවයක් විසින් නිලධාරීන් ගමන් කල WPPK-7225 දරන වෑන් රථයට නෙප්වුන් හෝටලය දෙස සිට ( සාක්ෂි අනුව වෑන් රථයට පිටුපසින් "W15" හෝටලය දෙස බලනවිට එම හෝටලයට වම් පසින් ප්‍රධාන මාර්ගයේ අයිනට වන්නට ) වෙඩි ප්‍රහාරයක් එල්ල කල බවට කරුණු අනාවරණය නොවන අතර එසේ වෙඩි ප්‍රහාරයක් එල්ලවී ඇතිනම් ඒ සඳහා වෑන් රථයේ සිටි

03 MAR 2025

පිරිස විසින් එල්ල කරන ලද ප්‍රතිප්‍රහාරය "W15" හෝටලයේ ඉහල මහලේ පිහිටි SPA Room වෙත එල්ල වීමට හැකියාවක් නොපවතින බවත්ය. මෙම සිදුවීම පිටුපසින් පැමිණි පොලිස් ජංගම මුර සංචාර රථයේ සිටි නිලධාරීන් නිරීක්ෂණය කර ඇති අතර, හෝටලයේ ආරක්ෂක නිලධාරියෙකු වෙඩි තැබීම සියැසින් දැක සාක්ෂි ලබා දී ඇත. එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුවද පැහැදිලිව තහවුරු වන කරුණක් වනුයේ WPPK 7225 වැන් රථයේ සිට එහි ගමන් කල උ.පො.ප. මධුරංග නිලධාරියා විසින් "W15" හෝටලය තම ඉලක්කය ලෙසට ගෙන මෙම මුල් වෙඩි තැබීම සිදුකර ඇති බවයි. මෙම නඩුවට විෂය වූ ප්‍රතිඵලයන් ද්විතීකව නිර්මාණය වීමට හේතු පාදක වී ඇත්තේ මධුරංග නිලධාරියා විසින් සිදුකල එම පළමු වෙඩිතැබීම බව සාක්ෂි අනුව නිගමනය කරමි.

සිදුවීම සම්බන්ධයෙන් එම කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් සත්‍යය වසන්කරමින්, අසත්‍ය කරුණු සහ සිද්ධි අධිකරණයට ඉදිරිපත් කරමින් සත්‍ය හෙළිදරවු වීම වැලැක්වීමට කටයුතු කර ඇති බව කරුණු අනුව එළඹිය හැකි නිගමනය වේ. සිදුවීමට පූර්වයෙන් දෙපාර්තමේන්තු විධිවිධාන ප්‍රකාරව නීත්‍යානුකූල අවසරයක් ලබාගැනීම මෙම නිලධාරීන් සිදුකර නොමැති බවද, වැලිගම පොලිස් වසම තුල මේ ආකාරයේ අපරාධ විමර්ශයන් සිදු කරන බව කිසිදු උසස් පොලිස් නිලධාරියෙකුට හෙලිදරව් නොකර රහසිගතව මෙම ක්‍රියාව සිදුකර ඇති බවද මෙම නඩුවේදී පෙනීයන කරුණකි. සිදුවීමෙන් පසුවද පොලිස් නිලධාරියෙකු නීත්‍යානුකූලව ඉටුකිරීමට බැඳී සිටින වගකීම් ඉටු නොකර සහ තුවාල කරුවන් විදිමත් ප්‍රතිකාර සඳහා උචිත ස්ථානයකට යොමු නොකර

සිදුවීමට එම නිලධාරීන් දක්වන සබැඳියාව වසන් කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනිමට සිදුවීම ආසන්න කොක්මාදුව අධිවේග අන්තර් හුවමාරුව සහ ආසන්නව ඇති රජයේ රෝහල් වන මාතර මහ රෝහල සහ වැලිගම රෝහල මගහැර පලායාමේ උත්සාහයන් ගෙන ඇති බවත්, පොලිස් නිලධාරීන් විසින් අපරාධයක් සිදුකර පලායන අපරාධ කරුවන් පිරිසක් ලෙසට නිගමනය කර විමර්ශනයට අදාලව රඳවා ගැනීම හේතුවෙන් එම පලායාමේ උත්සාහය ව්‍යර්ථ වී ඇති බවත් කරුණු සහ සාක්ෂි අනුව නිගමනය කරමි.

එම සියළුම හේතු, කරුණු සාක්ෂි සහ නිගමන එක්ව සලකා බලමින් අධිකරණය එළඹෙන නිගමනය වන්නේ "W15" හෝටලය ඉදිරිපිට 08 දෙනෙකුගෙන් යුතු කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් පිරිසක් විසින් කරන ලද ක්‍රියාව පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිදුකල නීත්‍යානුකූල රාජකාරියක් නොව නීති විරෝධී අරමුණක් මුදුන්පත් කරවා ගැනීම සඳහා සිදුකල අනීතික ක්‍රියාවක් බවයි. එසේ හෙයින් පොලිස් නිලධාරියෙකු සතුවියහැකි අපරාධ වගකීමෙන් වන මුක්තියක් මෙම එකඳු හෝ නිලධාරියෙකුට හිමි නොවන බව නිගමනය කරමි. එසේ හෙයින් එම අනීතික ක්‍රියාවලියේ ප්‍රතිඵලය වශයෙන් ඇතිවූ තත්වයන්ට අදාලව එම ක්‍රියාවලියට සම්බන්ධ වූ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට හේතු ප්‍රමාණවත් ලෙස පවතින්නේද යන්න අධිකරණය විසින් වෙන්වෙන් වශයෙන් තීරණය කල යුතුය.

වෙඩි තැබීම සිදුකල උප පොලිස් පරීක්ෂකවරයා විසින් තමා නීත්‍යානුකූල ක්‍රියාවක් සිදු නොකරන බව ප්‍රමාණවත් ලෙස දැන සිටියදීම රජයේ ගිනි අවියක්

03 MAR 2025

පොලිස් ආඥා පනතේ සහ A19 දෙපාර්තමේන්තු නියෝග වල සඳහන් නිගමනයට පටහැනිව භාවිතා කරමින් වෙඩිතැබීමක් සිදුකර "W15" හෝටලයට වෙඩි තැබීමෙන් වැරදි කිහිපයක් සම්බන්ධයෙන් අපරාධ වගකීමට යටත්විය යුතු බවට නිගමනය කරමි. වෙඩි තැබීම සිදුකල එම නිලධාරියාට එරෙහිව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 418 වගන්තිය ප්‍රකාරව දඬුවම් කලයුතු චෝදනාවක් පවරා පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට තීරණය කරමි.

තමන් විසින් සිදුකල වෙඩිතැබීම මගින් හෝටලයේ සිටි තැනැත්තන්, සේවකයින් සහ හෝ හිමිකරුවන්ට සාපරාධී බලහත්කාරය පෑම සම්බන්ධයෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 343 වගන්තිය යටතේ නඩුවක් පැවැත්වීමට හේතු පවතින බවටද නිගමනය කරමි. තවදුරටත් අධිකරණයේ නිගමනය වන්නේ මෙම සිදුවීමේදී මරණයට පත්වූ මරණකරු වන උපුල් චාමින්ද කුමාර නැමති පොලිස් නිලධාරියාගේ මරණය ප්‍රතිඵලය වූ ක්‍රියාව නිර්මාණය කරනු ලබන්නේ ඉහතකී මධුරංග නිලධාරියා විසින් නීති විරෝධීව සිදු කරන ලද "W15" හෝටලයේ වෙඩි තැබීමේ නිශ්චිත ක්‍රියාව මගින් බවයි. එම උප පොලිස් පරීක්ෂකවරයා විසින් සිදුකල එකී නීති විරෝධී සහ වගකීම් විරහිත වෙඩි තැබීමේ ක්‍රියාව නොවන්නට පොලිසිය විසින් ආත්මාරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කිරීමක් සිදු නොකරන අතර, උපුල් කුමාර නිලධාරියාගේ මරණය ප්‍රතිඵලය වන ද්විතීක තත්වය උත්පාදනය නොකරයි. වෙඩි තැබීම කල තැනැත්තා පොලිස් නිලධාරියෙකු බැවින් එවැනි අවස්ථානුගත තත්වයන් නිරමාණය වීමට තිබූ හැකියාව සම්බනධයෙන් ප්‍රමාණවත් දැනුමක් සතුව සිටි

අයකු බව අධිකරණයේ නිගමනයයි. එසේ හෙයින් නොසැලකිලිමත් ක්‍රියාවක් සිදුකරමින්, උපුල් කුමාර නිලධාරියාගේ මරණය ප්‍රතිඵලය වන ක්‍රියාව සිදු කිරීම සම්බන්ධයෙන් එකී උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියාට විරුද්ධව ලංකා දන්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය යටතේ නඩු කටයුත්තක් ඉදිරියට පවත්වාගෙන යෑමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි.

තවදුරටත් අධිකරණය තීරණය කල යුත්තේ මෙම ප්‍රශ්නගත සිදුවීමට අදාලව වෙඩි තැබීම සිදු කරන ලද උ.පො.ප. නිලධාරියාට අමතරව වෑන් රථයේ ගමන්කල සෙසු නිලධාරීන්ට සහ එම කටයුත්ත සඳහා පිරිස මෙහෙයව වන ලද බවට සාක්ෂි ඉදිරිපත්ව ඇති දේශබන්දු තෙන්නකෝන්, ටිරාන් අලස් යන අයට එරෙහිව අපරාධ නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් හේතු පවතින්නේද යන්නයි. මෙම නඩුවට අදාලව ඉදිරිපත්ව ඇති කරුණු අනුව සිදුවීමෙන් පසුව මියගිය පොලිස් නිලධාරියාට නීතිමය කාර්ය පටිපාටියෙන් පරිබාහිරව පොලිස් තෑගි අරමුදල හරහා සහ ජනාධිපති අරමුදල හරහා වන්දි අයකරවා දීමට මැදිහත් කිරීමක් සිදුකල බවට සහ සිදුවීම සාධාරණීකරණය කිරීම සඳහා මැදිහත් වීමක් කිරීම හැර වැරදි සම්බන්ධයෙන් මැදිහත් වීමක් කල බවට සිදුවීම සිදුවන අවස්ථාවේ ටිරාන් අලස් නැමැත්තාට එරෙහිව සාක්ෂි මේ දක්වා සිදු කරන ලද විමර්ශන වලින් අනාවරණය වී නොමැති බව නිගමනය කරමි. එසේ වුවද මුල් නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් සාපරාධී වගකීම පැවරීමට තරම් මැදිහත් වීමක් එම ටිරාන් අලස් යන අයගේ පැවතියේද යන්න විමර්ශන නිලධාරීන් තවදුරටත් විමර්ශනය කල යුතු බව අධිකරණයේ නිගමනයයි.

ශ්‍රී ලංකා අපරාධ නීතිය අනුව තවත් පුද්ගලයෙකු සිදු කරන ලද අපරාධ වගකීම සහිත වරදක් සම්බන්ධයෙන් ආධාර අනුබල දීමක් සිදු කරනු ලැබුවහොත් එම සිදුකල වරදට අදාලව එම ආධාර අනුබලදීමේ ක්‍රියාව කල තැනැත්තන්ද අපරාධ වගකීමට යටත්කල යුතු බවට නෛතික ප්‍රතිපාදන පවතී. මේ සම්බන්ධයෙන් පනතේ 100 සහ 101 වගන්ති මගින් නෛතික තත්වය සඳහන් කර ඇති අතර, දඬුවම් පැනවීම පිලිබඳව 102 වගන්තිය මගින් ප්‍රකාශිතව දක්වා ඇත.

100 වගන්තියේ ප්‍රකාශිතව සඳහන් කර ඇත්තේ, එහි (I) (ii) (iii) යන අවස්ථානුගත තත්වයන් අතරින් එක් ක්‍රියාමාර්ගයක් හරහා යම් වරදක් කරනු ලබන පුද්ගලයාට එම වරද කිරීමට යම් සහායක්, ආධාරයක් හෝ අනුබලයක් ලබා දෙන පුද්ගලයා ආධාර සහ අනුබලදීම නැමති වරද සිදුකරන බවයි. එකී 100 වගන්තිය ඇති පැහිදිළි කිරීම මෙම වරද සම්බන්ධයෙන් සාක්ෂිමය සලකා බැලීම සිදුකල යුතු ප්‍රවේශය පැහැදිළි කරයි.

<u>දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය :</u>

"පලමු ව - යම් දෙයක් කිරීමට යම් කෙනකු පොළඹවන තැනැත්තෙක්; හෝ

දෙවනු ව - යම් දෙයක් කිරීමට කුමන්ත්‍රණයක යෙදෙන තැනැත්තෙක්; හෝ

තුන්වනු ව - යම් දෙයක් කිරීමට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් චේතනාන්විතව සහාය වන තැනැත්තෙක්,

ඒ දෙය කිරීමට අනුබල දෙන්නේ ය.

පැහැදිලි කිරීම 1. - අනාවරණය කිරීමට තමා බැඳී ඇති යම් වැදගත් සිද්ධියක් ඕනෑකමින් ම වරදවා දැක්වීමෙන් හෝ ඕනෑකමින් ම වසන් කිරීමෙන් හෝ යම් කිසි දෙයක් ස්වේච්ඡාවෙන් ම

03 MAR 2025

> කරවන හෝ කිරීමට සලස්වන නැතහොත් කරවීමට හෝ කිරීමට සැලැස්වීමට තැත් කරන තැනැත්තෙක් ඒ දෙය කිරීමට පොළඹවන්නේ යැයි කියනු ලැබේ."

දණ්ඩ නීති සංග්‍රහයේ 101 වගන්තිය මගින් දක්වා ඇත්තේ අධාර අනුබලදුන් තැනැත්තා යන්න සාක්ෂිමය වශයෙන් නිගමනය කිරීමට අදාල නෛතික තත්වයන් මෙම වගන්තිය යටතේ අර්ථ නිරූපනය කරයි.

<u>101 වගන්තිය:</u>

> "වරදක් කිරීමට අනුබල දෙන හෝ අනුබල දෙන්නාට තිබිය යුතු චේතනාව ම හෝ දැනුම ම ඇතිව වරදක් කිරීමට නීතිය අනුව හැකියාවක් ඇති තැනැත්තකු විසින් කරන ලද නම් වරදක් වන ක්‍රියාවක් කිරීමට අනුබල දෙන තැනැත්තෙක් වරදකට අනුබල දෙන්නේ ය.
>
> පැහැදිලි කිරීම 1.- යම් ක්‍රියාවක් නීති විරෝධීව නොකර හැරීමකට අනුබල දීම, අනුබල දෙන්නා ඒ ක්‍රියාව කිරීමට බැඳී නැත ද වරදක් වීමට ඉඩ තිබේ.
>
> පැහැදිලි කිරීම 2.- අනුබල දීමේ වරදක් සංයුක්තව වීමට, අනුබල දෙනු ලැබූ වරද සිදු කිරීම හෝ වරද සංයුක්ත වීමට වුවමනා ප්‍රතිඵලය සිදු කිරීම හෝ අවශ්‍ය නොවේ."

ආධාර අනුබලදීමට අමතරව යම් තැනැත්තෙකු සිදු කරන ලද ක්‍රියාවක අපරාධ වගකීමට සමාන ලෙසට වෙනත් තැනැත්තෙකු අපරාධ වගකීමට යටත් කල හැකි සිද්ධාන්ත කිහිපයක් ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය තුල අන්තර්ගතව ඇත. ඒවා නම් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය මගින් නිරූපිත පොදු චේතනාව පිලිබඳ සිද්ධාන්තය, පොදු අදහස පිලිබඳ සිද්ධාන්තය, කුමන්ත්‍රණය පිලිබඳ නෛතික සිද්ධාන්තය සහ නීති විරෝධී රැස්වීමක සාමාජිකයින් වීම යන සිද්ධාන්තයයි. මෙම නඩුවට අදාලව ඉදිරිපත්ව ඇති කරුණු සලකා බැලීමෙන් පසුව අධිකරණයට එළඹිය හැකි නිගමනය වන්නේ "W15" හෝටලයට වෙඩි තබා අනර්ථය සිදු කිරීමේ වරද සංස්ථාපනය කරන ක්‍රියාව සිදු කිරීම සඳහා

නීත්‍යානුකූල නොවන නියෝගය ලබාදුන් දේශබන්දු තෙන්නකෝන් යන අයගේ නීත්‍යානුකූල නොවන අරමුණ සාක්ෂාත් කරලීම සඳහා 2023.12.31 දින WPPK-7225 රථයේ ගමන්කල නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමන්විත පිරිස පොදු අරමුණක් සහිතව කටයුතු කර ඇති බවයි. සිදුවීමට අදාලව වෙඩි තැබීම සිදුකර ඇති ආකාරය, ඒ සඳහා පහසුකම් සැලසෙන ආකාරයෙන් රථය මෙහෙයවා ඇති ආකාරය, එම නීති විරෝධී ක්‍රියාව සාක්ෂාත්කර ගැනීමට සහාය දැන්වීමෙන් සහ සිදුවීමෙන් පසුව එය අනාවරණය වීම වැලැක්වීම සඳහා සාමූහිකව කටයුතු කර ඇති ආකාරය අනුවද එම සමස්ථ ක්‍රියාවලිය තුලදී සත්‍යය අනාවරණය වීම වැලැක්වීම සම්බන්ධයෙන් සහ සෙසු කටයුතු සම්බන්ධයෙන් දේශබන්දු තෙන්නකෝන් යන අය අනීතිකව කටයුතු කර ඇති ආකාරයෙන්ද එම නිලධාරියා සහ කොළඹ අපරාධ කොට්ඨාශය නිලධාරීන් 08 දෙනා "W15" හෝටලයට අනර්ථය සිදු කිරීමේ සහ එහි සිටි අය සාපරාධී බලහත්කාරය පෑමේ නීති විරෝධී අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇති බව නිගමනය කල හැකිය. ඒ අනුව WPPK-7225 වැන් රථය තුල ගමන් කල නිලධාරීන් 08 දෙනා අතුරින් මියගිය නිලධාරියා හැර සෙසු නිලධාරීන් 07 දෙනාට නීති විරෝධී රැස්වීමක සාමාජිකයන් වීම සම්බන්ධයෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 140 වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සම්බන්ධයෙන් නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි.

එමෙන්ම එම නීති විරෝධී අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සිය බලය, තනතුර භාවිතා කරමින්ද සිය යටත් නිලධාරීන් මෙහෙයවමින්ද, සාමය ආරක්ෂා

කිරීමට සහ අපරාධ වැලැක්වීමට රජය විසින් පොලිස් දෙපාර්තමේන්තුවට නිකුත් කල නිල වාහන, නිල ගිනිඅවි, උණ්ඩ සහ සෙසු සම්පත් භාවිතා කරමින් වරදක් කිරීමට මෙම නිලධාරීන් පිරිස චේතනාන්විතවම මෙහෙයවීමට කටයුතු කර ඇති බවත් එසේ හෙයින් එම දේශබන්දු තෙන්නකෝන් යන අයට විරුද්ධව සෙසු තැනැත්තන් සමග "W15" හෝටලයට වෙඩිතබා අනර්ථය සිදුකිරීමේ වරද සහ සෙසු වැරදි වලට අදාලව 113A වගන්තියේ අර්ථනිරූපනයට ඇතුලත් කුමන්ත්‍රණය කිරීම නැමති වරද සිදු කිරීමෙන් එහි 113A වගන්තිය මගින් දඩුවම් කල යුතු වරදක් සිදුකල බවද,

පොලිස් නිලධාරීන් වන කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් 08 දෙනෙකු "W15" හෝටලයට වෙඩි තැබීමේ නීති විරෝධී අරමුණ සාක්ෂාත් කර ගැනීමේ කාරණය සඳහා වූ නීති විරෝධී රැස්වීමට නීති විරෝධී ලෙස යෙදීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 147 වගන්තිය මගින් දඩුවම් කලයුතු වරදක් සිදුකල බවටද, ක්‍රියාව සම්බන්ධයෙන් උත්පාදනය වන අනුශාංගික වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පවත්වා ගෙන යාමට හේතු පවතින බවටද නිගමනය කරමි.

ඒ අනුව නඩුවට අදාලව ඉදිරිපත්ව ඇති සියළුම කරුණු සලකා බැලීමෙන් අනතුරුව අධිකරණයට සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ, වැඩබලන පොලිස්පතිවරයා ලෙස සිටි දේශබන්දු තෙන්කෝන් යන අය විසින් " W15 " හෝටලයට අදාලව අනර්ථය, සාපාරාධී බලහත්කාරය පෑම ආදී සහ හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් එහි අයිතිකරුවන්ට, රැඳි සිටින්නන්ට හෝ සේවකයින්ට එරෙහිව සිදු කිරීම සඳහා තමාගේ යටතේ සිටින පොලිස්

නිලධාරීන් අට දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් නීති විරෝධී ආකාරයෙන් රජය සතු නිල වාහන, ගිනි අවි, උණ්ඩ ආදියද සමඟ යොදවා ඇති බවයි. එකී දේශබන්දු තෙන්නකෝන් යන අයගේ නීති විරෝධී අරමුණ පොදුවේ දරමින් එය සාක්ෂාත් කර ගැනීම සඳහා එම නිලධාරීන් අට දෙනාම නීති විරෝධී ක්‍රියාවලියක සාමූහිකව යෙදී ඇති බවත්, වැඩිදුරටත් නිගමනය කළ හැකි තත්ත්වයකි. එම ක්‍රියාවලිය අතරතුරදී පිරිස අතරින් උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියාට මරණ ආයුධයක් ( Deadly weapon) යන අංක 1515969 ( පැ.30 ) දරණ T – 56 – 2 වර්ගයේ ස්වංක්‍රීය රයිෆල් තුවක්කුවකින් වෙඩි තැබීම මගින් W15 හෝටලයට අනර්ථයක් සිදු කර ඇති බවත්, ඒ ක්‍රියාවලිය හරහා එහි රැඳි සිටින්නන්, සේවකයින්, සහ හෝ අයිතිකරුවන්ට සාපරාධී බලහත්කාරය පැමකට ලක් කළ බවට ප්‍රමාණවත් කරුණු හෙළිදරව් වී ඇති බවටද වැඩිදුරටත් නිගමනය කරමි. නීති විරෝධී අරමුණක් ඉටුකර ගැනීම සඳහා දේශබන්දු තෙන්නකෝන් යන අය විසින් සිය යටත් නිලධාරීන් වන පොලිස් නිලධාරීන් නීති විරෝධී ලෙසට යොදා ගැනීම මගින් වැරදි සංස්ථාපනය වී ඇති බවත්, එම තත්ත්වය හේතුවෙන් මියගිය මරණයට අදාලව සහ පොලිස් නිලධාරියා තුවාල ලැබීම සම්බන්ධයෙන් සහ පොදු දේපලක් වශයෙන් පවතින WP PK- 7225 රථයට අනර්ථයක් සිදුවීම සම්බන්ධයෙන් එම දේශබන්දු තෙන්නකෝන් යන අයට එරෙහිව සහ කොළඹ අපරාධ කොට්ඨාශයේ සෙසු නිලධාරීන් අටදෙනා සම්බන්ධයෙන් අපරාධ වගකීමක් ජනනය වී ඇති බවත්, එසේ හෙයින් එම සියළු දෙනාටම විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු අනාවරණය වන බවටද නිගමනය කරමි.

ප්‍රශ්නගත නීති විරෝධී අරමුණ සාක්ෂාත් කර ගැනීමට අනුගමනය කරන ලද ක්‍රියාවලියේදී එම තැනැත්තන්ට එරෙහිව වැලිගම පොලිසියට අනුයුක්ත නිලධාරීන් විසින් ආත්මආරක්ෂාවේ අයිතිය නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමෙන් පසුව අනාවරණ තත්වය වසන් කිරීම සඳහාත්, එයට අදාලව පවත්වනු ලබන විමර්ශන කටයුතු සහ අධිකරණමය කටයුතු ව්‍යාකූල සහ අර්ථ ශුන්‍ය කිරීමේ මෙන්ම සත්‍ය හෙළිදරව් වීම වැළැක්වීමේ අරමුණින් දේශබන්දු තෙන්නකොන්, කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් සහ වැලිගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් යන නිලධාරීන් කටයුතු කර ඇති බවට කරුණු විමර්ශනයේදී අනාවරණය කරගෙන ඇත. හරක්කටා නමැත්තාගේ ගෝලයින් පිළිබඳව වැටලීමකට මෙම නිලධාරීන් පිරිස යොමුකළ බව හැඟවීමට ලේඛන සහ සටහන් පසුව ව්‍යාජ ලෙස නිර්මාණය කර අධිකරණයට ඉදිරිපත් කර ඇති බවටත්, සිදුවීම පිළිබඳව බොරු සාක්ෂි සහ ප්‍රකාශ ලබාදීමක් නිලධාරියා විසින් සිදුකර ඇති බවටත්, සිදුවීම වන අවස්ථාවේ වෑන් රථයට පිටුපස දෙසින් නාඳුනන තැනැත්තෙකු එල්ල කළ වෙඩි ප්‍රහාරයක් පිළිබඳව අසත්‍ය සහ නිර්මාණය කරන ලද සිද්ධියක් කියාපෑමෙන් විමර්ශන අඩාල කිරීමට කටයුතු කර ඇති බවටත්, සාක්ෂි පවතින බැවින් ඒ මත උද්ගත වන අපරාධ වැරදි වලට අදාලව නඩු කටයුත්තක් ඉදිරියට පවත්වාගෙන යාමට ප්‍රමාණවත් හේතු පවතින බවටද නිගමනය කරමි.

දේශබන්දු තෙන්නකෝන් යන අය සහ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරින් එක්ව නිර්මාණය කරන ලද එම අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමට චේතනාන්විතව දායකත්වය දක්වමින්, අධිකරණය විසින් පවත්වන ලද

විමර්ශනයට ඉදිරිපත් කිරීම සඳහා පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා විසින් වෙඩි තබන ලද උණ්ඩ සංඛ්‍යාව පිළිබඳව වැරදි සංඛ්‍යාත්මක අගයන් ඇතුලත් කර වෙඩි තැබීමෙන් ඉතිරි උණ්ඩ සංඛ්‍යාව සම්බන්ධයෙන් සහ හිස් පතරොම් කොපු සංඛ්‍යාව සම්බන්ධයෙන් දෝෂ සහගත සටහන් යෙදීමෙන් වැලිගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති උපුල් නිලධාරියා බෙරු සාක්ෂි ගෙතීමේ ක්‍රියාවෙන් සහ නීත්‍යානුකූලව විමර්ශන නිලධාරියා ලෙස තමන් බැඳී සිටින පොලිස් දෙපාර්තමේන්තු වගකීමට පටහැනිව අකීකරුව ක්‍රියා කිරීමෙන් කර ඇති වැරදි පිළිබඳව එම අයට විරුද්ධව නඩු කටයුතු පැවැත්වීමට ප්‍රමාණවත් හේතු පවතින බවටද, වැඩිදුරටත් නිගමනය කරමි. එසේ වුවද, එම නිලධාරියාට එම චෝදනා පිළිබඳව නඩු පැවරීමේ කාරණය වෙනම නඩුකරයක් ලෙස ආරම්භ කළ යුතු බවද කරුණු අනුව වැඩිදුරටත් නිගමනය කරමි.

සියළුම කරුණු අනුව අධිකරණය මේ පිළිබඳව එළඹෙන සලකා බැලිමක් වන්නේ, නීතියේ ආධිපත්‍යය සහ අපරාධ යුක්ති කළමණාකාරණ දෘෂ්ටියෙන් ගත් විට මෙම හෙළිදරව් වන කරුණු අතිශය බරපතල ලෙස අධිකරණ මනස සහ මහජන මනස කම්පනයට ලක්වන තත්ත්වයක් බවයි. නීතියේ ආධිපත්‍යයේ මූලික සිද්ධාන්තය වන්නේ, ස්ථාපිත නීතියේ රාමුවට ඉහලින් කිසිවෙකු නොපවතින බවත් රාජ්‍යයක සෑම කෙනෙකුම සම්මතව ඇති නීතියේ ප්‍රතිපාදනයන්ට යටත් බවයි. අපරාධ යුක්ති කළමණාකරණ දෘශ්ටියෙන් සලකා බැලීමේදි ශ්‍රී ලංකාවේ සාමය ආරක්ෂා කිරීමේත් අපරාධ, වරදවල් වැළැක්වීමේත් ඉහළම වගකීම දරන්නේ පොලිස්පතිවරයා සහ ඔහුගේ යටතේ පරිපාලනය වන පොලිස් දෙපාර්තමේන්තුවයි. එවැනි වගකීමක් දරමින් සිටියදී

මෙම නඩුවේ විමර්ශනය විසින් සනාථ කර ඇත්තේ, ශ්‍රී ලංකා පොලිසියේ වැඩ බලන පොලිස්පතිවරයා ලෙසට 2023.12.31 දින වන විට ධූරය හොබවන ලද දේශබන්දු තෙන්නකෝන් නමැති නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින්ම තමාගේ පරිපාලනයට යටත් නිලධාරීන් අට දෙනෙකුගෙන් සමන්විත පිරිසක්, රජය සතු ගිනි අවි, උණ්ඩ සමඟ, රජය සතු වාහනයකින් සිය පෞද්ගලික අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා අනීතිකව සහ අත්තනෝමතික ලෙසටත් නීතියෙන් අපේක්ෂිත සියළු වගකීම්, වගවීම්, උල්ලංඝනය කරමින්ද අපරාධ වැරදි සිදුකිරීම සඳහා යොදවා ඇති බවයි. මහජන මුදලින් වැටුප් ලබන රජයේ පොලිස් නිලධාරීන්ව සිටිමින්, රජයේ මුදල් යොදවා මිලදී ගත් රාජ්‍ය දේපලක් භාවිතා කරමින් රාජ්‍යයේම පුරවැසියන්ට එරෙහිව පැරා මිල්ටරි කණ්ඩායමක් ලෙසට සංවිධානය වී කටයුතු කරමින් අපරාධ සිදු කිරීම අතිශය බරපතල තත්ත්වයක් බවත්, නිගමනය කරමි. මෙම තත්ත්වය තව දුරටත් බරපතල කරවන කරුණක් වන්නේ, පොලිස්පතිවරයා විසින් අනීතික ලෙස අපරාධ වැරදි සිදුකරීමට යොදා ගත් පිරිස අතර සිටි එක් පොලිස් නිලධාරියෙකු එම අනීතික ක්‍රියා කලාපයේදි සිදු වූ ආනුශංගික නීතිය ක්‍රියාත්මකවීමකදී මරණයට පත්ව තිබීමයි. එසේ හෙයින්, එම අනීතික ක්‍රියා කලාපය මගින් රාජ්‍යයට පුරවැසියෙකුද, පොලිස් දෙපාර්තමේන්තුවට නිලධාරියෙකුද, බිරිඳකට ස්වාමි පුරුෂයෙකුද, කිසිවක් නොදන්නා අහිංසක දරුවන් තිදෙනෙකුට සිය රැකවරණයද, ආරක්ෂාවද, ආදරයද, අධ්‍යාපන පහසුකම්ද සලසන ලද පියෙකුද අහිමිකර තිබීමයි. සියළු විමර්ශකයන්ද, පරිපාලකයින්ද, බලධාරීන්ද ඉහලම මට්ටමින් මෙම බරපතල තත්වය සිය සැලකිල්ලට ලක් කළ යුතු බවත්, මෙවැනි තත්ත්වයන් යලිත් සිදු

නොවීමට අදාලව ගත යුතු සෑම ආකාරයකම ක්‍රියාමාර්ග හැකි ඉහලම මට්ටමින් ගත යුතුව ඇති බවටත් නිරීක්ෂණය කරමි.

පැරාමිල්ටරි කණ්ඩායමක් යන පාඨය Oxferd අර්ථ කෝෂය මගින් හඳුන්වා දී ඇත්තේ රාජ්‍යයේ නීත්‍යානුකූල සන්නද්ධ බලවේගවල සාමාජිකයන් ලෙසට සංවිධානය වී අනීතික කටයුතු තුළ යෙදෙන සංවිධානාත්මක අනීතික අවිදරන කණ්ඩායම් වශයෙන්. Britannica අර්ථ කෝෂය Paramilitary යන පාඨය Group or Organization that Operates Outside a Countries formed military Structure ලෙස අර්ථ දක්වයි. මෙම නඩුවට අදාලවද ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් නීතියේ සීමාවන්ට පරිබාහිරව අනීතික අවිගත් කණ්ඩායමක් වශයෙන් නීතිවිරෝධී කටයුත්තක නිරතව ඇති බව මෙම නඩුවේදී හෙලිදරව් වී ඇති කරුණකි. එය නිතියේ විධානය සහ ආධිපත්‍යය පිළිබඳ සළකා බැලීමේදී බලවත් බිඳවැටීමක් බවට අධිකරණයේ නිගමනයයි.

කොළඹ අපරාධ කොට්ඨාශයේ මෙම නීතියට පරිභාහිරව සිදු කරනු ලබන අනීතික ක්‍රියාකාරකම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද 2024.05.31 දින තීන්දු ප්‍රකාශිත SCFR 505/2019 නඩුවේදී ද එස්. තුරෙයිරාජා මහින්ද, සමයවර්ධන, අර්ජුන ඔබේසේකර යන ත්‍රීපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් නිරීක්ෂණය කර ඇත. මෙම නඩුවේ වැරදි සිදු කරන ලදැයි තීරණය කරන ලද දේශබන්දු තෙන්නකෝන් යන අය කොළඹ අපරාධ කොට්ඨාශයට අදාළව නඩුවේ 11 වන වගඋත්තරකරු වශයෙන්ද, කොළඹ අපරාධ කොට්ඨාශයට අදාළ තවත් නිලධාරීන් දෙදෙනෙකු

03 MAR 2025

13 සහ 14 වගඋත්තරකරුවන් වශයෙන්ද එම නඩුවේදී මූලික අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් වරදකරුවන් වී ඇති බව නිගමනය කරමි. එකී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ 89 සිට 91 ඡේදයන් තුල එම නීති විරෝධී සිදුවීමට සම්බන්ධ පාර්ශවයන් අනාවරණය කර ගැනීමක් සිදු කර ඇත. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුකරයේ 11 වන වගඋත්තරකරු වන දේශබන්දු තෙන්නකෝන් යන අය මෙම නඩුවට පාදක වූ සිදුවීමේදීද වැඩ බලන පොලිස්පති ලෙසට අනීතික ක්‍රියාවට මූලිකත්වය ලබා දී ඇති අතර නඩුවේ 13 වගඋත්තරකරුගේ උපදෙස් මත 14 වන වගඋත්තරකරු සමඟ ක්‍රියාවට සම්බන්ධ වි ඇති බවට නම් සඳහන් SI Maduranga නිලධාරියා මෙම නඩුවට අදාළ සිදුවීමේදී නීති විරෝධී ලෙස ගිණි අවිය ක්‍රියාත්මක කළ නිලධාරියා බවට නිගමනය කළ හැකිය. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේදී මෙම නිලධාරින්ගේ නීති විරෝධී ක්‍රියාකාරීත්වය ගරු එස්. තුරෙයිරාජා විනිසුරු තුමන් පහත පරිදි තීරණය කර ඇත.

> "The Conduct of the respondents, Judge even by the lowest of Standards, is a magnificent failure of all that the Rule of law stands for. They have no doubt acted in a manner unbefitting of public office"

එමෙන්ම එවැනි ආකාරයේ නීති විරෝධී ආකාරයේ වැරදි සිදුවීම වලක්වා ගැනීමට අදාළව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ඉහළ නිලධාරීන්ගේ ඉහළ මට්ටමේ අධීක්ෂණ වගකීම මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වැඩිදුරටත් නියම කර ඇත. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ නියමයන් ඒ ආකාරයෙන්

ක්‍රියාවට නැගීම මගින් පොලිස් නිලදාරීන් සිය බලය අනීතිය ලෙස යෙදීමෙන් සිදුකල හැකි නෛතික උල්ලංඝනය කිරීම් වරදවල් සිදු කිරීම් සහ අපරාධ වැලැක්වීම සිදුකළ හැකි බව මෙම අධිකරණයේද නිගමනයයි.

සිදුවීමෙන් පසුවද මහේස්ත්‍රාත්වරයාගේ නීත්‍යානුකූල නියෝග නොසලකා හරිමින් සිද්ධිය පිළිබඳව CCTV දර්ශන අධිකරණයට ඉදිරිපත් වීම අනීතික ආකාරයෙන් වළක්වාලමින්ද, බොරු සාක්ෂි නිර්මාණය කරමින් සහ අධිකරණයට ඉදිරිපත් කරමින්ද වැරදි සිදු කරන ලද සියළුම පොලිස් නිලධාරීන් කටයුතු කර ඇති බව අනාවරණය වී ඇති බැවින්, ඉදිරියට පවත්වන විමර්ශන වලදී එම තැනැත්තන් ඍජුව හෝ වක්‍රව කලහැකි බලපෑම් වලක්වාලන අයුරින් ආරක්ෂිතව සහ ශක්තිමත්, අපක්ෂපාති විමර්ශනයක් පැවැත්වීමේ වගකීමක් විමර්ශන නිලධාරීන් සතුවන බවද මෙහිදි වැඩිදුරටත් සැලකිල්ලට ගනිමි. මෙම වැරදි සිදු කිරීමට සම්බන්ධ වී ඇතැයි මෙහි ඉහත නිගමනය කරන ලද නිලධාරීන් පොලිස් දෙපාර්තමේන්තුව තුළ දරණ ඉහළ තනතුරු, වගකීම් සහ සබඳතා හේතුවෙන් විමර්ශන වලට දැඩි බලපෑමක් එල්ලවීමේ අවධානමක් පවතින බැවින් එකී බලපෑමේ හැකියාවක් ශුන්‍ය වන පරිද්දෙන් එම නිලධාරීන් නීතිමය ප්‍රතිපාදන මත පදනම්ව පොලිස් සේවයෙන් ඉවත් කර තබා මූලික විමර්ශන පියවර ක්‍රියාත්මක කිරීම වඩාත් සාධාරණ සහ යුක්ති සහගත විමර්ශන පියවර වන බවට සියළුම කරුණු සලකා වර්තමාන පොලිස්පති ධූරයේ වැඩබලන නිලධාරියාට නියම කරමි.

එසේ හෙයින් ඉහත සලකා බලන ලද සියළු සාක්ෂි, වාර්තා, කරුණු සහ නීතිමය තත්ත්වයන් සලකා බැලීමෙන් අනතුරුව අධිකරණය විසින් එළඹෙන ලද නිගමනයන් පහත පරිදි සංශිප්තව ප්‍රකාශයට පත් කරමි.

(අ) මෙම නඩුවට විෂයගත සිදුවීමේදී මරණයට පත් වූ මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර නමැති තැනැත්තාගේ මරණයට බලපාන ලද ආශාසමාන හේතුව රයිෆල් වෙඩි පහරවල් හේතුවෙන් ඔහුගේ ශරීරයේ වම් පෙනහැල්ලට සිදු වූ තුවාල හේතුවෙන් වම් උරස් කුහරය තුළට රුධිරය සහ තරලය වාතය සමඟ පාර්ශවීය ලෙස පිරියාමෙන් ඇති වූ හිමොපෙයුමොතොරෙක්ස්(Hemopaeumothorax) නමැති සංකූලතාවයක් බවට තීරණය කරමි. ඒ අනුව මරණ සහතිකයක් එම හේතුව සඳහන් කරමින් නිකුත් කරන ලෙසත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට නියම කරමි.

(ආ) එම මරණකරුගේ මරණයට හේතු වු වෙඩිතැබීම සිදු කරන ලද යුද හමුදා සැරයන් 02725 චන්දිමාල් රුවිරංග නිලධාරියාට හෝ එම වෙඩිතැබීම අණදීම සිදු කළ පොලිස් සැරයන් 16829 ඉමදූව විතානගේ අජිත් සිසිර කුමාර යන අයට එරෙහිව මෙම නියෝගයේ ඉහත දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය කෙල ආත්මාආරක්ෂාවේ අයිතිය නැමති නෛතික සිද්ධාන්තය යටතේ සාධාරණීකරණය කළ හැකි නිල රාජකාරි තත්ත්වය යටතේ සිදුකල ක්‍රියාවක් බැවින් එකී මරණය සම්බන්ධයෙන් අපරාධ වගකීමක් පැවැරීමට හේතුවන නෛතික තත්ත්වයන් උත්පාදනය වි නොමැති බව නිගමනය කරමි.



03 MAR 2025

(ඇ) එම (ආ) හි සඳහන් කළ නෛතික පදනම මතම වෙඩි තබා උපපොලිස් පරීක්ෂක මධුරංග යන නිලධරියාට තුවාල කිරීම සම්බන්ධයෙන් හෝ රජයට අයත් පොදු දේපල වන WP PK – 7225 වැන් රථයට ස්වයංක්‍රීය ගිනි අවියකින් වෙඩි තබා අනර්ථයක් සිදු කිරීම යන ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් වැලිගම පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම මුර රාජකාරියේ යෙදී සිටියදී වෙඩි තැබීම සිදු කළ යුද හමුදා සැරයන් රුවිරංගට හෝ අණදීම සිදු කළ පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර යන අයට එරෙහිව අපරාධ වගකීමක් කිසිදු ආකාරයකින් නොපැවරෙන බවත්, ඔවුනට විරුද්ධව නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට හේතු නොපවතින බවටත්, වැඩිදුරටත් නිගමනය කරමි.

(ඇ) නීත්‍යානුකූල නියෝගයක් යටතේ නොව සාපරාධි අරමුණක්ව පැවැති වැලිගම, පැලැන "W15" හෝටලයට ස්වයංක්‍රීය ගිනි අවියකින් වෙඩි තබා අනර්ථයක් සිදු කිරීම සහ එහි සිටින සහ හෝ අයිතිව සිටින සහ හෝ කළමණාකරණය කරන සහ හෝ තැනැත්තන් සාපරාධී බලහත්කාරය පෑමේ අරමුණ සහිතව කටයුතු කරමින් T–56 වර්ගයේ ස්වංක්‍රීය ගිනි අවියකින් "W15" හෝටලයට වෙඩි තැබීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 408 වගන්තියේ අර්ථ නිරූපණය අනුව කියවිය යුතු 410 වගන්තිය යටතේ දඩුවම් කළ යුතු සහ 418 වගන්තිය යටතේ දඩුවම් සිදු කළ යුතු අනර්ථය නමැති වැරදි සම්බන්ධයෙන්ද,

(ii) පොලිස් නිලධාරියෙකු ලෙස තමා ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බැඳී සිටින පොලිස් ආඥාපනත, දෙපාර්තමේන්තු

නියෝග සහ සෙසු නීතියේ නියමයන්ට අකීකරුවීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 162 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු වැරදි සම්බන්ධයෙන්ද,

(iii) පොලිස් නිලධාරියෙකු වශයෙන් එම කාල වකවානුවේදී ස්ථාපනය වී තිබූ ආරක්ෂක තත්ත්වය සහ ක්‍රමවේදය යටතේ, නීති විරෝධී නියෝග මත කරනු ලැබූ නීත්‍යානුකූල නොවන වෙඩි තැබීමක් සිදු කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵලයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්භාවයකින් සිටියදී ප්‍රශ්නගත වෙඩි තැබීම සිදුකර, පොලිස් නිලධාරීන්ට එල්ල වූ වෙඩි ප්‍රහාරයක් ඇතිකිරීමට හේතුවන නොසැලකිලිමත් ක්‍රියාව සිදුකර මානින්ගමුව ගෙදර උපුල් චාමින්ද කුමාර නමැති පොලිස් නිලධාරියාගේ මරණය දක්වා විහිදීගිය ක්‍රියාවක් සිදු කිරීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තියේ ප්‍රතිපාදන යටතේ දඬුවම් කළ යුතු සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් නොවන අපරික්ෂාකාරි හෝ නොසැලකිලිමත් ක්‍රියාවක් කිරීමෙන් එම අයගේ මරණය සිදුකිරීම නමැති වරද සිදු කිරීමෙට අදාලවද, උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියාට විරුද්ධව නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි.

(ඉ) මාතර, වැලිගම "W15" හෝටලයට T -56 ස්වයංක්‍රීය ගිනි අවියකින් වෙඩි තැබීමෙන් එම හෝටලයට අනර්ථයක් සිදුකිරීම සහ හෝ එම හෝටලයේ සිටින තැනැත්තන්ට, එහි කළමණාකාරීත්වයට සහ හෝ හිමිකරුවන්ට සාපරාධී බලහත්කාරය පෑම යන අපරාධ අරමුණු මුදුන්පත්

03 MAR 2025

කර ගැනීම සඳහා නීති විරෝධී රැස්වීමක සාමාජිකයන් වීම සම්බන්ධයෙන්,

01. උප පොලිස් පරීක්ෂක මධුරංග.

02. පොලිස් පරීක්ෂක එම්.ආර්. දුනුසිංහ.

03. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලම් ද සිල්වා.

04. පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත.

05. පොලිස් සැරයන් 69480 කුමාර.

06. පොලිස් කොස්තාපල් 2204 ප්‍රියනාත්.

07. පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ගිහාන් පියතිස්ස.

යන නිලධරීන් 07 දෙනාට විරුද්ධව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 140 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු නීති විරෝධි රැස්වීමක් සාමාජිකයන් වීම, 141 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු මාරක ආයුධ කිහිපයක් අතැතිව නීති විරෝධි රැස්වීමක සාමාජිකයන් වීම, 144 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු 143 වගන්තියෙන් අර්ථ නිරූපිත කැරලි ගැසීම නමැති වරද සිදුකිරීම, 145 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු මාරක ආයුධයක් අතැතිව කැරලි ගැසීම යන වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි. එමෙන්ම එම සියළුම නිලධාරීන්ට එරෙහිව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 162 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු වරදක්

පිළිබඳව නඩු කටයුතු ඉදිරියට ගෙනයාමට ප්‍රමාණවත් හේතු පවතින බවටද නිගමනය කරමි.

03 MAR 2025

(ඊ) රාජකාරිමය කටයුත්තක් නොවන සිය පෞද්ගලික අභිමතාර්ථයක් ලෙසට පැවති වැලිගම, පැළැන W15 හෝටලයේ සිටින තැනැත්තන්ට, සේවකයින්ට, සහ හෝ කළමණාකාරීත්වයට සහ හෝ හිමිකරුවන් සාපරාධි ලෙස බියගැන්වීම සඳහ සහ අනර්ථය සිදු කිරීමට අදාලව තත්කාලයේ වැඩබලන පොලිස්පති ධූරයේ රාජකාරි කරමින් සිටි බස්නාහිර පළාත්භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නමැති නිලධාරියාට එරෙහිව ඔහු විසින් සිය යටත් පොලිස් නිලධාරීන් ලෙස සිටි කොළඹ අපරාධ කොට්ඨාශයට අනුයුක්ත මහජන වැටුප් ලබන පොලිස් නිලධාරීන් අට දෙනෙකු, රජය සතු නිල ගිනි අවි,රජයේ උණ්ඩ, රජය සතු පොදු දේපලක් සහ WP PK – 7225 දරණ වෑන් රථය නීතියේ පනවා ඇති නීත්‍යානුකූල නියෝගයන් සහ රාජකාරිමය ලෙසට තමා බැඳී සිටින නීතිමය වගකීම් වලට අකීකරුව කටයුතු කිරීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 162 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු, යම් තැනැත්තෙකුට හෝ ආණ්ඩුවට හානියක් සිදු කිරීමේ චේතනාවෙන් නීතියේ විධානයකට රජයේ සේවකයකු ලෙස අකීකරු වීම නමැති වරද සිදු කිරීම සම්බන්ධයෙන්ද,

ඉහත (ඉ) ඡේදය යටතේ විස්තර කරන ලද නීති විරෝධී රැස්වීමක එහි සඳහන් පොලිස් නිලධාරීන් අට දෙනෙකු ( මියගිය නිලධාරියාද ඇතුලත්ව) පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙසට යොදා ගැනීමෙන් ලංකා දණ්ඩ

නීති සංග්‍රහයේ 147 වගන්තිය යටතේ දඬුවම් කළ යුතු වරදක් සිදු කිරීම සම්බන්ධයෙන්ද,

ඉහත ( ඊ) අනු ඡේදයේ ආරම්භයේ විස්තර කරන ලද නීති විරෝධී අරමුණ සාක්ෂාත් කර ගැනීමට අදාලව එම පිරිස් සමඟ කුමන්ත්‍රණය කිරීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 113 (අ) වගන්තිය යටතේ දඬුවම් කළ යුතු සහ සිදුවීමෙන් අනතුරුව සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් සත්‍යය අධිකරණ විමර්ශන කටයුත්තේදී නිරාවරණය වීම වැලැක්වීම සඳහා ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 188, 189 වගන්තිවල අර්ථ නිරූපණය සමඟ කියවිය යුතු 190 වගන්තියෙන් දඬුවම් කළ යුතු බොරු සාක්ෂි ගෙතීම නමැති වරදට අදාලවද, නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් අවස්ථානුගත තත්ත්වයක් පවතින බවටද නිගමනය කරමි.

(උ) ඉහත (ඈ) ඡේදයේ (i) සඳහන් වැරදි සිදු කිරීම සඳහා උප පොලිස් පරීක්ෂක මධුරංග නිලධාරියා සමඟ පොදු අදහසින් කටයුතු කර ඇති බැවින්, එම රථයේ ගමන්කළ මරණයට පත් වූ නිලධාරියා හැර සෙසු නිලධාරීන් 06 දෙනාද, එකී අනීතික ක්‍රියාව මඟින් අපරාධ වරදක් සිදුකිරීමට නියෝග ලබා දුන් දේශබන්දු තෙන්නකෝන් යන අයටද ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ පොදු චේතනාව නමැති නෛතික සංකල්පය යටතේ එකී එක් එක් නිලධාරියා කල වැරදි සම්බන්ධයෙන්ම සමාන ලෙස වගකීමට යටත් වන බවට කරුණු අනුව එළඹිය හැකි නෛතික තත්ත්වය බැවින් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති යටතේ එම ඉහත

03 MAR 2025

සඳහන් කරන ලද තැනැත්තන්ට එරෙහිව නඩු කටයුත්තක් චෝදනා නගා ඉදිරියට පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි.

(ඍ) ප්‍රශ්නගත සිදුවීම ඇතිවීමෙන් පසුව එහි සත්‍ය කරුණු අධිකරණයට නිරාවරණය වීම වැළැක්වීම සඳහා තුන්වන පාර්ශවයක් විසින් වැන් රථයට වෙඩි ප්‍රහාරයක් එල්ල කළ බවට සහ නිල රාජකාරි කටයුත්තක් ඉටුකිරීමට පිරිස "W15" හෝටලය අසළට පැමිණ සිටි බවට ව්‍යාජ ලෙස එත්තු ගැන්වීම සඳහා අසත්‍ය ප්‍රකාශ ලබාදීමෙන්, ව්‍යාජව සකස් කරන ලද ලේඛන ඉදිරිපත් කිරීමට චේතාන්විතව කටයුතු කිරීමෙන් එම WP - 7225 වැන් රථයේ ගමන් කළ මියගිය නිලධාරියා හැර සෙසු තැනැත්තන් හත්දෙනාටම එරෙහිව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 180, 189 වගන්ති සමඟ කියවිය යුතු 190 වගන්තියෙන් දඬුවම් කළ යුතු බොරු සාක්ෂි ගෙතීම නමැති වරදට අදාලව චෝදනා නගා නඩු කටයුත්තක් ඉදිරියට පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට වැඩිදුරටත් නිගමනය කරමි.

(එ) එලෙස බොරු සාක්ෂි ගෙතීමේ කටයුත්තට වැලිගම පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක උපුල් කුමාර නමැති නිලධාරියා චේතනාන්විතව කටයුතු කර ඇති බවත්, එලෙස නිර්මාණය කරන ලද සහ ගොතන ලද සාක්ෂි සහ කරුණු අධිකරණයට වාර්තා කර ඇති බවත්, තහවුරු වී ඇති බැවින්, එම නිලධාරියාට විරුද්ධව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 190 වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන්ද, පොලිස්



Adheesha Ariyathilaka

නිලධාරියෙකු ලෙස නීතියෙන් ඉටු කිරීමට බැඳී සිටින කටයුත්තකට අදාලව එම කටයුත්ත සිදුකර ඇති බැවින්ද, ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 162 වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන්ද චෝදනා ගොනුකර නඩු කටයුත්තක් ඉදිරියට පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් හේතු පවතින බවට නිගමනය කරමි. එසේ වුවද, එම නිලධාරියාට එරෙහිව නඩු පැවැරීම මෙම නඩුකරය නොවන වෙනත් නව නඩුකරයක් මගින් සිදුකළ යුතු බවට සියළුම කරුණු සලකා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියම කරමි.

(ඒ) මෙම ඉහත සලකා බලන ලද ගිනි අවියක් භාවිතා කිරීමෙන් W15 හෝටලයට අනර්ථයක් සිදු කිරීම සහ හෝ රැඳී සිටින අයට, සේවකයින්ට සහ හෝ හිමිකරුවන්ට සාපරාධී බලහත්කාරය සිදුකිරීම යන වැරදි සම්බන්ධයෙන් මෙම නඩුවේදී ක්‍රියාව සිදු කිරීමෙන් සහ වෙනත් ආකාර වලින් එහි වගකීමට යටත් විය යුතු යැයි තීරණය කරන ලද සියළුම අයට විරුද්ධව 182 අධිකාරිය වන තුවක්කු ආඥා පනතේ 44 (ආ) වගන්තිය යටතේ සහ හෝ 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වගන්ති ප්‍රකාරවද නඩු කටයුතු පවත්වාගෙන යාමට තරම් හේතු පවතින බවට සියළුම සලකා බැලීම් අනුව නිගමනය කරමි.

(ඔ) පොදු දේපලක් වන WP PK- 7225 වෑන් රථයට සිය ක්‍රියාව තුලදී අනර්ථයක් සිදු කිරීමෙන් පොදු දේපල පනත යටතේ වරදක් කල බවට නඩු කටයුතු එකී සියළුම තැනැත්තන්ට විරුද්ධව පවත්වාගෙන යාමට හේතු පවතින බවටද වැඩිදුරටත් නිගමනය කරමි.

මහේස්ත්‍රාත් අධිකරණය
03 MAR 2025
මාතර

ඒ අනුව ඉහත එළඹෙන ලද නිගමනයන් ප්‍රකාරව

01. උප පොලිස් පරීක්ෂක මධුරංග.

02. පොලිස් පරීක්ෂක එම්.ආර්. දුනුසිංහ.

03. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇනස්ලම් ද සිල්වා.

04. පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත.

05. පොලිස් සැරයන් 69480 කුමාර.

06. පොලිස් කොස්තාපල් 2204 ප්‍රියනාත්.

07. පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ශිහාන් පියතිස්ස.

08. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්.

යන තැනැත්තන් මෙම නියෝගයෙහි පිටපත් සහිතව නීතිපතිතුමාට සහ වැඩබලන පොලිස්පතිවරයාට, අත් අඩංගුවට ගන්නා බවට ලිඛිතව දැන්වීමෙන් අනතුරුව, අත් අඩංගුවට ගෙන මෙම නඩුවේ සැකකරුවන් ලෙසට නම් කරමින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියම කරමි.

අ.කලේ.

බී.ඒ.අරුණ ඉන්ද්‍රජිත් බුද්ධදාස

මහේස්ත්‍රාත් - මාතර

2025.02.27

Adheesha Ariyathilaka

03 MAR 2025

ඉහතින් දැක්වෙන්නේ මාතර මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී.ආර්.6314/23 දරණ නඩුවේ පිටු අංක 1 සිට 82 දක්වා වූ 2025.02.27 දිනැති නියෝගයෙහි සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

සැකසුවේ:

සැසඳුවේ:

ලදුපත් අංකය: 4/26 094447

2025.3.3.

රෙජිස්ට්‍රාර්

රෙජිස්ට්‍රාර්,
මාතර මහේස්ත්‍රාත් අධිකරණය,
ලෑබීම - කඹුරුගමුව.

Adheesha Ariyathilaka